දෙවැනි කොටස

දෙවැනි කොටස

	පිටුව
මහ බැංකුවේ ගිණුම් හා කටයුතු	1 - XLIV
කාර්ය මණ්ඩල පුවත්	XLIV-XLV

මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

	පිටුව
ගිණුම් හා බැංකු කටයුතු	I
ව්‍යවහාර මුදල් නිකුතුව	IX
බැංකු සංවර්ධනය	IX
බැංකු අධීක්ෂණය	XII
බැංකු නොවන මූල්‍යආයතන	XIII
සංවර්ධන මුදල්	XV
ග්‍රාමීය ණය	XXVII
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු	XXX
ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය	XXXII
සේවක අර්ථසාධක අරමුදල	XXXII
විනිමය පාලන	XXXIV
රාජ්‍ය ණය	XXXV
ප්‍රාදේශීය කාර්යාල -මාතර, අනුරාධපුර සහ මාතලේ.	XXXVII
ලේකම් දෙපාර්තමේන්තුව	XXXVIII
ප්‍රවෘත්ති සහ ප්‍රකාශණ	XXXVIII
පර්යේෂන කටයුතු	XXXIX
සමීක්ෂණ හා දත්ත එක් රැස් කිරීම	XXXIX
දත්ත සැකසුම්	XL
පුහුණු කිරීම්	XLII
කළමනාකාරීත්ව විගණන	XLII
පරිශ්‍ර	XLII
සුභසාධනය	XLIII
ආරක්ෂක සේවා	XLIV
කාර්ය මණ්ඩල පුවත්	XLIV

මහ බැංකුවේ ගිණුම් කටයුතු

ගිණුම් හා බැංකු කටයුතු

1994 වර්ෂය අවසානය වන විට මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 155,957 ක් වී පෙර වර්ෂයට වඩා සියයට 16.7 ක වර්ධනයක් වාර්තා කළේය. 1992 වර්ෂයට වඩා 1993 වර්ෂයේදී බැංකුවේ වත්කම් වගකීම්වල වැඩිවීම සියයට 32 කි. 1994 දෙසැම්බර් මස 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1994 දෙසැම්බර් මස 31 න් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

වත්කම් අංශයෙහි බැංකුවේ ජාත්‍යන්තර සංචිත සියයට 25.5 කින් රුපියල් දශලක්ෂ 75,896 සිට රුපියල් දශලක්ෂ 95,282 දක්වා ඉහළ ගියේය. මුළු වත්කම්වල ජාත්‍යන්තර සංචිත දැරූ කොටස 1993 දී සියයට 56.8 සිට 1994 දී සියයට 61.1 දක්වා වැඩි වී විශාලතම වත්කම් කාණ්ඩය බවට පත් විය. බැංකුවේ දේශීය වත්කම් සියයට 4.9 කින් රුපියල් දශලක්ෂ 30,273 සිට රුපියල් දශලක්ෂ 31,755 දක්වා ඉහළ ගිය අතර අනෙකුත් වත්කම් හා ගිණුම් සියයට 5.3 කින් රුපියල් දශලක්ෂ 27,465 සිට රුපියල් දශලක්ෂ 28,921 දක්වා වැඩිවිය.

දේශීය වත්කම් අතර රජයට දුන් ණය සහ අත්තිකාරම් හා රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් පිළිවෙලින් සියයට 8.9 කින් හා සියයට 29.0 කින් ඉහළ ගියේය. ශුද්ධ ආපසු ගෙවීම් හා අක්‍රිය ණය සඳහා වූ ප්‍රතිපාදන හේතුකොට ගෙන වාණිජ බැංකු හා අනෙකුත් ණය දෙන ආයතනවලට වූ ණය පහසුකම් සියයට 20.4 කින් පහත වැටුණි. මෙම වර්ෂය තුළදී කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ක්‍රම අත්හිටුවන ලද හෙයින් වාණිජ බැංකු වලට වූ කෙටිකාලීන අත්තිකාරම් සියයට 90.4 කින් පහත වැටුණි.

වගකීම් අංශයෙහි සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් සියයට 19.8 කින් රුපියල් දශලක්ෂ 35,949 සිට රුපියල් දශලක්ෂ 43,081 දක්වා ඉහළ ගියේය. බැංකුවේ වත්කම් හා වගකීම් වල ප්‍රධාන අංශ සැසඳීමක් 2.2 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. මහ බැංකුව වෙතැති මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 51,461 සිට රුපියල් දශලක්ෂ 61,023 දක්වා සියයට 18.6 ක ඉහළ යැමක් වාර්තා කළේය. තැන්පතු, වගකීම්වල විශාල කාණ්ඩය වී මුළු වගකීම් වලින් සියයට 39.1 ක් විය. මෙම කාණ්ඩය තුළ වාණිජ බැංකුවල තැන්පතු සියයට 21.3 කින් වැඩි විය. ජාත්‍යන්තර ආයතන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතනවල තැන්පතු සියයට 14.6 කින් ඉහළ ගියේය.

1994 දී බැංකුවේ ආදායම රුපියල් දශලක්ෂ 25,680 ක් වූ අතර පෙර වර්ෂයට වඩා සියයට 112.3 ක ඉහළ යැමක් පෙන්නුම් කළේය. ආදායම් වර්ධනයට විශාල වශයෙන් දායක වූයේ, විදේශීය ආයෝජන මගින් ඉපැයූ පොළී ආදායමය. කෙසේ වෙතත්, බැංකුවේ දේශීය වත්කම් වලට හිමි කොටස පහත වැටීම පිළිබිඹු කරමින් දේශීය ගණුදෙනුවලින් ඉපැයූ පොළී ආදායම පහත වැටුණි. සංචිත ගිණුම් සඳහා වෙන් කිරීම් සහ ක්ෂය කිරීම් සහ අනෙකුත් අය කිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන ද වෙන් කළ පසු ශේෂ වූ ශුද්ධ ලාභය වන රුපියල් දශලක්ෂ 1,400 මුදල් නීති පනතේ 39(ඇ) වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා රජයට ගෙවීමට වෙන් කෙරුණි.

ගණකාධිකරණ ප්‍රතිපත්ති

1. පොදු

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළිගැණුන ගණකාධිකරණ මූලධර්මයන්ට අනුකූලව මේ සමඟ ඇති ශේෂ පත්‍රය හා ලාභලාභ ගිණුම පිළියෙල කර ඇත.

2. විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල්වලින් පවත්වාගෙන යනු ලබන වත්කම් හා බැරකම් ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුනු මධ්‍ය විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කර ඇත.

2.1 සංඛ්‍යා සටහන

1993.12.31 වැනි දින හා

ශ්‍රී ලංකා මහ බැංකුවේ

වගකීම්

1993 දෙසැම්බර් මස 31 දින			1994 දෙසැම්බර් මස 31 දින	
		ප්‍රාග්ධන ගිණුම		
1,50,00,000		ප්‍රාග්ධනය	1,50,00,000	
98,50,00,000	100,00,00,000	අතිරික්තය	98,50,00,000	100,00,00,000
		සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්		
3,457,94,20,385		නෝට්ටු	4,149,61,02,836	
136,98,56,920	3,594,92,77,305	කාසි	158,49,59,668	4,308,10,62,504
		තැන්පතු		
180,05,60,301		රජය	281,23,22,857	
5,24,69,885		රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන	14,16,39,414	
2,046,61,90,194		වෙළෙඳ බැංකු	2,483,21,27,774	
2,829,13,50,601		ජාත්‍යන්තර සංවිධාන, විදේශිය රාජ්‍ය හා විදේශිය බැංකු ආයතන	3,243,01,15,310	
1,82,897		භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු:3,16,06,400/- හැර අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල	11,99,835	
85,07,30,033	5,146,14,83,911	අනෙකුත්	80,52,89,256	6,102,26,94,446
	492,50,00,000	මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල		492,50,00,000
	56,02,50,000	ප්‍රාග්ධන දයක දිමනා ගිණුම		56,02,50,000
	215,50,00,000	ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්		374,00,00,000
	3,758,32,69,681	අනෙකුත් වගකීම් හා ගිණුම්		4,162,84,92,604
	13,363,42,80,897			15,595,74,99,554

1994 දෙසැම්බර් මස 31 දිනෙන්

1993 දෙසැම්බර් මස 31 දින		1994 දෙසැම්බර් මස 31 දින
1,109,77,61,934	සාමාන්‍ය වියදම් (වැටුප් මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නිති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම්	2,427,98,78,851
100,00,00,000	**වර්ෂයේ ශුද්ධ ලාභය** මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට	140,00,00,000
1,209,77,61,934		2,567,98,78,851

එච්. බී. දිසානායක
අධිපති

එම්. බී. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරි

1994.12.31 දිනවල

ශේෂ පත්‍රයත් සැසදිම

රුපියල්

වත්කම්

1993 දෙසැම්බර් මස 31 දින			1994 දෙසැම්බර් මස 31 දින	
		ජාත්‍යන්තර සංචිතය		
1,760,33,00,568		පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ	1,261.76,30,949	
5,827,35,22,029 *		විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්	8,264,75,83,119 *	
1,88,90,383	7,589,57,12,980	විශේෂ ආපසු ගැනීම් හිමිකම්	1,65,41,327	9,528,17,55,395
		දේශීය වත්කම්		
2,085,54,99,947		ණය සහ අත්තිකාරම් රජයට	2,271,88,99,947	
415,06,04,897**		අනෙකුත් අයට මධ්‍යම හා දීර්ඝ කාලීන	** 330,41,88,300	
75,26,05,641		කෙටිකාලීන	7,22,30,621	
395,42,12,029		රජයේ සහ රජය සහතිකකල සුරැකුම් පත්	509,95,46,732	
56,02,50,000	3,027,31,72,514	මුල්‍ය සහ අනෙකුත් ආයතන වලට දයක දිමනා	56,02,50,000	3,175,51,15,600
	2,746,53,95,403	අනෙකුත් වත්කම් හා ගිණුම්		2,892,06,28,559
	13,363,42,80,897			15,595,74,99,554

*1964 පෙබරවාරි මස 01 දින රු: 55,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 දින රු: 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් සුරැකුම්පත් ඇතුලත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙළින් රු: 29,33,697/- ක් සහ රුපියල් 34,340/- ක් විය.)

** රුපියල් දශලක්ෂ 100.0 ක විශේෂ ණයමුදලින් පියවා නොමැති ප්‍රමාණය ඇතුලත් වෙයි. පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන් අයකරගත නොහැකි ණය සඳහා ප්‍රතිපාදන අඩුකර ඇත.

අවසන් වූ වර්ෂයේ ලාභ ලාභ ගිණුම

රුපියල්

1993 දෙසැම්බර් මස 31 දින		1994 දෙසැම්බර් මස 31 දින
1,209,77,61,934	පොලී ආදිය	2,567,98,78,851
1,209,77,61,934		2,567,98,78,851

විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1994 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1949 අංකː 58 දරණ මුදල් නිති පනතේ 42(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

එකී මුදල් නිති පනතේ42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමැතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරේනු ඇත.:

1995 අප්‍රේල් මස 24 දින,
කොළඹ 7,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

එස්. එම්. සබ්රි
විගණකාධිපති.

3. ආයෝජන

සියලුම ආයෝජනයන් පිරිවැය අනුව අගය කර ඇත.

4. අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම්, මූල්‍ය සමාගම් වෙතින් අය විය යුතුව ඇති අක්‍රිය ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව වන ශුද්ධ ශේෂය වෙයි.

5. ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ ඒවායෙහි පිරිවැය අනුව වටිනාකමෙන් ක්ෂය කිරීම් අඩු කිරීමෙනි. පහත දැක්වෙන අනුපාතිකයනට අනුකූලව, හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරී ගිණුම්ගත කර ඇත.

ගොඩනැගිලි	සියයට	2
සවි කිරීම් හා උපකරණ	සියයට	10
කාර්යාලීය ලීබඩු හා උපකරණ	සියයට	10
මෝටර් රථ	සියයට	10
කුඩා පරිගණක උපකරණ	සියයට	25

වසර තුළ දී මිල දී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය සඳහා ප්‍රතිපාදනය කරනු ලබන අතර යම් වර්ෂයකදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හි එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නැත.

6. තොග

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුළ දී දරනු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර වර්ෂ අවසානයේ අතැති තොග සම්බන්ධයෙන් ගැලපීම් සිදු කර නැත.

7. අයභාර ගණනය

මුදල් පදනමක් මත ගණනය කර ඇති අක්‍රිය ණය වෙනුවෙන් වූ පොළී හැරුණ විට අනෙකුත් පොලී හා ආදායම් උපචිත පදනමක් මත පොත්වල සටහන් කර ඇත.

8. මහ බැංකු සුරැකුම් පත් හා සම්බන්ධිත වට්ටම් හා අධිමිළ

වර්ෂය තුළ නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පත් සම්බන්ධව දුන් වට්ටම් හා ලැබූ අධිමිල, එම සුරැකුම්පත් පරිණත වීමේ දිනය සැලකිල්ලට නොගෙන, වර්ෂය සඳහා වූ ලාභාලාභ ගිණුමෙහි ඇතුළත් කර ඇත.

9. ශුද්ධ ලාභය

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය, සියලුම වියදම් හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව වේ .

I. අක්‍රිය ණය සඳහා ප්‍රතිපාදන
II. ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන
III. අනෙකුත් ප්‍රතිපාදන හා මුදල් නීති පනතේ 38 වන වගන්තිය අනුව සංචිත සඳහා වෙන් කිරීම්

විදේශ විනිමය කටයුතු

මහ බැංකුව විසින් ඇ. එ. ජ. ඩොලරයට සම්බන්ධිතව ඉදිරි විනිමය මිළට ගැනීම් ඇතුළුව එතැන් ගැණුම් සහ විකුණුම් මගින් විදේශීය විනිමය ගණුදෙනු කටයුතු වර්ෂය තුළදී කරගෙන යන ලදී.

මහ බැංකුව විසින් සිය විදේශීය විනිමය සංචිත, ජාත්‍යන්තර මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳ පොළවල ආයෝජනය කිරීම තවදුරටත් කරගෙන යන ලදී.

2.2 සංඛ්‍යා සටහන

1993 සහ 1994 මුදල් වර්ෂයන්ගේ අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම

අයිතමය	වගකීම්			
	1993		1994	
	රුපියල් දශලක්ෂ	%	රුපියල් දශලක්ෂ	%
ප්‍රාග්ධන ගිණුම	1,000.0	0.8	1,000.0	0.6
සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල්	35,949.3	26.9	43,081.1	27.6
තැන්පතු	51,461.5	38.5	61,022.7	39.1
මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල	4,925.0	3.7	4,925.0	3.2
ප්‍රාග්ධන දයක දීමනා ගිණුම	560.2	0.4	560.2	0.4
මහ බැංකු සුරැකුම්පත්	2,155.0	1.6	3,740.0	2.4
අනෙකුත් වගකීම්	37,583.3	28.1	41,628.5	26.7
එකතුව	1,33,634.3	100.0	1,55,957.5	100.0

අයිතමය	වත්කම්			
	1993		1994	
	රුපියල් දශලක්ෂ	%	රුපියල් දශලක්ෂ	%
ජාත්‍යන්තර සංචිතය	75,895.7	56.8	95,281.8	61.1
දේශීය වත්කම්	30,273.2	22.7	31,755.1	20.4
අනෙකුත් වත්කම්	27,465.4	20.5	28,920.6	18.5
එකතුව	1,33,634.3	100.0	1,55,957.5	100.0

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1994 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකුවලින් මිළදී ගන්නා ලද විදේශ මුදල් වල වටිනාකම රුපියල් දශලක්ෂ 31,451.7 ක් වූ අතර, විකුණන ලද විදේශ මුදල්වල වටිනාකම රුපියල් දශලක්ෂ 615.1 ක් විය. එය 1993 වසර හා සැසඳීමේ දී මිළදී ගන්නා ලද හා විකුණන ලද මුළු විදේශීය මුදල් ප්‍රමාණයන්හි වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 31,332.4 ක් හා රුපියල් දශලක්ෂ 914.6 ක් විය.

2.3 සංඛ්‍යා සටහන
විදේශීය විනිමය ගණුදෙනු 1994

(රුපියල් වලින්)

මාසය	එතැන් ගැනුම්	එතැන් විකුණුම්	ඉදිරි විනිමය ගැනුම්
ජනවාරි	4,96,07,14,637.50		
පෙබරවාරි	411,09,82,600.00		
මාර්තු	475,44,28,150.00	17,28,03,750.00	78,81,20,000.00
අප්‍රේල්	252,29,65,162.50		
මැයි	74,08,875.00		
ජූනි	165,53,45,625.00		
ජූලි	261,02,37,350.00		
අගෝස්තු	192,18,72,837.50		
සැප්තැම්බර්	290,89,11,000.00		
ඔක්තෝබර්	370,78,91,750.00		
නොවැම්බර්	26,84,32,500.00	44,22,49,000.00	
දෙසැම්බර්	123,43,45,000.00		
	3,066,35,35,487.50	61,50,52,750.00	78,81,20,000.00

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

එකතුව
මුළු ගැණුම් 3,145,16,55,487.50
මුළු විකුණුම් 61,50,52,750.00

රන් සහ රිදී අලෙවිය

වර්ෂය තුළදී මහ බැංකුව විසින් සිය ප්‍රධාන කාර්යාලයේ කවුළුවෙන් රන් සහ රිදී අලෙවිය තවදුරටත් කර ගෙන යන ලදී. 1993 වර්ෂයේ රුපියල් දශලක්ෂ 9.5 හා සසඳා බලන කළ 1994 වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයේ කවුළුවෙන් අලෙවි කරන ලද රන්වල වටිනාකම රුපියල් දශලක්ෂ 12.1 ක් විය. 1994 වර්ෂයේ දී රිදී අලෙවියෙහි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 0.2 ක්වූ අතර, 1993 වර්ෂය සඳහා එය රුපියල් දශලක්ෂ 2.7 ක් විය.

ආසියානු නිෂ්කාශණ සංගමය

ආසියානු නිෂ්කාශණ සංගමය මගින් කෙරුණු ගණුදෙනු ප්‍රමාණයේ මුළු වටිනාකම පසුගිය වසරේ පැවැති රුපියල් දශලක්ෂ 22,735 හා සසඳා බලන කළ 1994 දී රුපියල් දශලක්ෂ 37,195.2 ක් විය. 1993 වසරේ රුපියල් දශලක්ෂ 7,424.0 හා සසඳන විට 1994 දී විදේශිය මුදල් වලින් සිදු කෙරුණු ශුද්ධ පියවීම්වල රුපියල් වටිනාකම රුපියල් දශලක්ෂ 13,833.7 ක් විය. ඉරානය සමඟ කරන ගණුදෙනුවල දී ඇතිවන දුෂ්කරතාවයන් ලිහිල් කිරීම පිණිස 1994 මැයි මස සිට සියලුම ආනයනකරුවන්ට හා අපනයනකරුවන්ට ආසියානු නිෂ්කාශණ සංගමයේ පියවීම් වලින් බැහැරව ගණුදෙනු කිරීම සඳහා අනුමැතිය දෙන ලදී.

මහ බැංකු පොළී අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණ.

කෙටිකාලීන ණය

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හා අපනයන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු වෙත ලබාදුන් ප්‍රතිමූල්‍ය ණය පිළිවෙලින් 1994. 04. 01 දින සහ 1994. 05. 31

දින සිට බලපැවැත්වෙන පරිදි නවතා දමන ලදී. එසේ වුවද, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය නවතා දැමීමට පෙර වාණිජ බැංකු විසින් එම ක්‍රමය යටතේ ගොවීන්ට දුන් උපලේඛණගත ණය සඳහා, එම උපලේඛණ ගත ණය මත වාණිජ බැංකු වලට ප්‍රතිමූල්‍ය පහසුකම් තවදුරටත් සලසන ලදි. මෙම පහසුකම් යටතේ 1994 වර්ෂය අවසානයේ නොපියවා පැවැති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 72.2 ක් විය. කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ණය ක්‍රම යටතේ 1993 සහ 1994 වර්ෂයන්හිදී නොපියවා පැවති ශේෂ පහත සඳහන් පරිදි වේ.

2.4 සංඛ්‍යා සටහන

පියවිය යුතුව ඇති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයන්

රුපියල් දශලක්ෂ

ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය		
නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය	582.9	72.2
අපනයන ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය		
කාණ්ඩ I	33.2	-
කාණ්ඩ II	107.2	-
වී සහ අනෙකුත් බෝග ගබඩා කිරීම සඳහා වූ ණය ක්‍රමය	26.2	-
තේ කම්හල් හිමියන් සඳහා වූ විශේෂ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය	3.1	-
එකතුව	752.6	72.2

මැදි හා දිගුකාලීන ණය

1994 වර්ෂය තුළ දී මැදි හා දිගුකාලීන ණය අරමුදල රුපියල් දශලක්ෂ 4,925 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණ. මුද හරින ලද ණය අඩු කළ පසු වර්ෂය තුළදී ආපසු ගෙවන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 562 ක් විය.

මූල්‍ය සමාගම් සඳහා පහසුකම්

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ 20 (4) (අ) සහ 21 (1) වගන්ති ප්‍රකාර, දුෂ්කරතාවයකට පත් මූල්‍ය සමාගම් සඳහා ණය පහසුකම් සැලසීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදි. 1994 දී මෙම පහසුකම යටතේ මුද හරින ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 254 ක්වූ අතර, 1994 වර්ෂය අවසාන වන විට නොපියවා පැවැති ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,304 ක් විය.

සංචිත අවශ්‍යතා

වාණිජ බැංකුවල තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 1994 පෙබරවාරි මස 18 වැනි දින ප්‍රතිශෝධනය කරන ලදී.

වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් සඳහා පැවැති සියයට 15 ක්වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය අවුරුද්ද මුළුල්ලේම නොවෙනස්ව පැවැතිණ. එහෙත් වාණිජ බැංකු ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කර ඇති විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් වෙනුවෙන් පනවා තිබූ සියයට 15 ක සංචිත අවශ්‍යතා අනුපාතය 1994 පෙබරවාරි මස 18 වැනි දින සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. වාණිජ බැංකුවල අනෙකුත් විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් සඳහා වූ සියයට 15 ක සංචිත අවශ්‍යතා අනුපාතය වසර තුළදී වෙනස් නොවීය.

විවට වෙළෙඳපොළ කටයුතු

ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි 1993 වසර තුළදී රුපියල් බිලියන 94.8 ක් වූ භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1994 වසර තුළදී රුපියල් බිලියන 21.2 දක්වා අඩු විය. ඒ අතර, එම කාලය තුළදීම මෙම වෙළෙඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් රුපියල් බිලියන 46.9 සිට රුපියල් බිලියන 18.9 දක්වා පහත වැටුණි. ද්විතියික වෙළෙඳපොළ ගණුදෙනු

පහළ මට්ටමක පැවැතීමට මූලික වූයේ, කෙටිකාලීන ආයෝජන භාණ්ඩාගාර බිල්පත් ද්විතියික වෙළෙඳපොල භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනීම් වෙළෙඳපොළට මාරුවීම සහ අතිරික්ත මහ බැංකු සුරැකුම්පත් අලෙවිය වේ.

ගතවූ වර්ෂය තුළදී මාස තුනකින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් සඳහා ද්විතියික වෙළෙඳපොලෙහි පැවති ඵලදායීතා අනුපාතය වර්ෂයකට සියයට 17.26 සහ 20.07 අතර මට්ටමක පැවතුණි.

භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රති -මිළදී ගැනීම් වෙළෙඳපොළ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රති-මිළදී ගැනීම් ක්‍රමය යටතේ, භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1994 වසර තුළදී තවදුරටත් කරගෙන යන ලදි. මේ යටතේ 1994 වසරේ විකුණනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් වල මුළු වටිනාකම රුපියල් බිලියන 230.9 කි. ප්‍රතිමිළදී ගැනීමේ ගිවිසුම යටතේ එක් දිනක ප්‍රතිමිළදී ගැනීම් ඵලද අනුපාතය වසර මුලදී සියයට 16.5 ක් වූ අතර, එය ක්‍රමයෙන් අඩුවී ඔක්තෝම්බර් මැද භාගය වනවිට සියයට 7 ක් විය. කෙසේ වෙතත් වසර අවසානය වන විට වෙළෙඳපොලෙහි ද්‍රවශීලතා තත්වයෙහි හිඟයක් ඇතිවීමත් සමග එක් දින ප්‍රතිමිළදී ගැනීමේ අනුපාතය, 1994 දෙසැම්බර් වන විට සියයට 20 දක්වාද ක්‍රමයෙන් ඉහළ ගියේය.

මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණා සහගත ගෙවීම

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධව ගෙවීම් ක්‍රම, රජය වෙනුවෙන්, මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදි. 1993 රුපියල් 2,76,609.24 හා සසඳා බලන කළ 1994 දී මෙම යෝජනා ක්‍රමය යටතේ වූ මුළු සහනාධාර ගෙවීම් රුපියල් 1,12,785.72 ක් විය. මේ අතර, 1993 දී වූ රුපියල් 38,775 හා සසඳන විට 1994 දි කළ කරුණා සහගත ගෙවීම් ප්‍රමාණය රුපියල් 32,175 ක් විය.

අපනයනකරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

අපනයනකරුවන්ට ගෙවන ලද ආනයන තීරුබදු ප්‍රතිදාන සඳහා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද හිමිකම් ප්‍රතිපූරණය කිරීම රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදි. 1993 දී ගෙවූ රුපියල් දශලක්ෂ 784.6 හා සසඳා බලන කළ 1994 දී ප්‍රතිපූරණය කරන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 839.7 ක් විය.

අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල

රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදලේ පරිපාලනය ද 1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරිකිරීම් පනත සහ 1972 අංක 15 දරණ ආදායම් උපරිම සහ අනිවාර්ය ඉතිරිකිරීම් පනත යටතේ එකතු කරන ලද මුදල් වල භාරකාර කටයුතු ද මහ බැංකුව විසින් තවදුරටත් සිදු කරන ලදි. වර්ෂය තුළදී දයකයන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් අටක් සඳහා රුපියල් දශලක්ෂ 0.05 ක් (පොළිය ද ඇතුළුව) බැංකුව විසින් ගෙවන ලදී.

රජයේ ගිණුම්

රජයේ බැංකුකරු ලෙස මහ බැංකුව විසින් රජයේ දෙපාර්තමේන්තුවල, රජයේ නියෝජ්‍යායතන, ආයතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන යාම තවදුරටත් කරගෙන යන ලදී.1993 වසර තුළ ක්‍රියාත්මක වෙමින් පැවැති ගිණුම් සංඛ්‍යාව 184ක් වූ අතර එය 1994 දෙසැම්බර් මස වන විට එය 178 ක් විය.

විදේශීය මූල්‍යාණය

වර්ෂය තුළදී මහ බැංකුව විසින් රජය වෙනුවන් විවිධ විදේශීය ණය සහ ප්‍රදාන යටතේ මුද හරින ලද ණය මුදල් ලබාගැනීම සහ විදේශීය ණය ආපසු ගෙවීම් තවදුරටත් කරගෙන යනලදී.

ව්‍යවහාර මුදල් නිකුතුව

දේශීය ගණුදෙනු සඳහා ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ බලධාරියා වශයෙන් ඉටු කල යුතු කාර්‍යයභාරය 1994 වර්ෂය තුළදී ද ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් ඉටු කරන ලදි. 1994 වර්ෂය අවසානය වන විට සංසරණයෙහි පැවැති ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 43,081 ක් විය. සංසරණයෙහි පැවැති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙන් සියයට 96 ක් නෝට්ටු වලින් සමන්විත විය.

බැංකුව විසින් රුපියල් දෙකක වටිනාකමකින් යුතුවූ සාමාන්‍ය සංසරණය සඳහා නිකුත් කළ හැකි සමරු කාසියක් නිකුත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු පිළියෙල කොට ඇත. කෘෂිකර්ම හා ආහාර සංවිධානයේ පනස්වෙනි සංවත්සරය සැමරීම සඳහා වූ මෙම කාසිය 1995 මැද භාගයේ දී පමණ මහජනතාව වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

දැනට සංසරණයෙහි පවතින ශ්‍රී ලංකාවේ උරුමය පිළිබඳ කාණ්ඩයේ, රුපියල් සියයේ නෝට්ටුවෙහි පසුපිට ඇති වර්ණ රටාව වෙනස් කිරීමට 1994 වර්ෂයේදී කටයුතු කරන ලදි. මෙම වෙනස ඇති කරන ලද්දේ රුපියල් සීයයේ නෝට්ටුවෙහි පසුපිට ඇති වර්ණ රුපියල් පන්සීයයේ නෝට්ටුවෙහි ඇති වර්ණවලට සාමානතාවයක් ඇති බවට දක්වන ලද පොදුජන අදහස් සැලකිල්ලට ගැනීමෙනි. 1994 දෙසැම්බර් මාසයේදී මෙම නව නෝට්ටුව සංසරණය සඳහා නිකුත් කෙරුණි.

1992 වර්ෂයේ දී ස්ථාපනය කර ක්‍රියාත්මක කරන ලද ස්වයංක්‍රිය ව්‍යවහාර මුදල් සකස් කිරීමේ යන්ත්‍ර පද්ධතිය 1994 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. අළුත් මෝස්තරයේ ශ්‍රී ලංකාවේ උරුමය පිළිබඳ කාණ්ඩයේ නෝට්ටු සැකසීමේ හැකියාව ඇතිවන පරිදි මෙම ක්‍රමය නැවත සුසර කිරීම අවශ්‍ය වූ අතර මෙම වෙනස්කම් ඇති කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදි.

1992 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන මහ බැංකුවේ ජංගම ව්‍යවහාර මුදල් ප්‍රදර්ශනය 1994 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක විය. 1994 දී ද මෙම ජංගම ප්‍රදර්ශනයේ දී, අඩුපාඩු සහිතව මුද්‍රිත ශ්‍රී ලංකාවේ නෝට්ටු සහ කාසි මෙන්ම ලෝකයේ බොහෝ රටවල ව්‍යවහාර මුදල් නෝට්ටුවල සහ ව්‍යාජ නෝට්ටුවල ආදර්ශ ආකෘතිද ප්‍රදර්ශනය කෙරුණි.

බැංකු සංවර්ධන

බැංකු ශාඛා පද්ධතිය පුළුල් වීම

සංවර්ධන බැංකු සහ ඉතිරිකිරීමේ බැංකුද ඇතුලුව ක්‍රියාත්මකව තිබූ මුළු බැංකු සංඛ්‍යාව 1994 වසර තුලදි 44 ක් ලෙස නොවෙනස්ව පැවැතිණි. 1994 වසර අවසානය වන විට සමස්ථ බැංකු ක්‍රමය තුළ වාණිජ බැංකු 23 ක්ද (දේශීය වාණිජ බැංකු 6 ක් සහ විදේශීය වාණිජ බැංකු 17 ක් ඇතුළුව) ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැං.) 17 ක්ද සංවර්ධන බැංකු 3 ක්ද එක් ඉතිරිකිරීමේ බැංකුවක් ද තිබිණි. 1994 වසර තුලදී මිඩ්ල්රීස්ට් බැංකුවේ කොළඹ ශාඛාවේ අයිතිය මුස්ලිම් කොමර්ෂල් බැංකුව විසින් පවරා ගන්නා ලදි.

1994 වසර තුළදී වාණිජ බැංකු, ප්‍රා. ග්‍රා. සං. බැං. හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි ශාඛා ජාලය තවදුරටත් පුළුල් විය. ක්‍රියාත්මකව පවතින මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 1,147 දක්වා වැඩි කරමින් නව බැංකු ශාඛා 45 ක් ගත වූ වසර තුළ පිහිටුවන ලදි. මෙය 1993 වසර හා සසඳන කල සියයට 3.9 ක වර්ධනයක් පෙන්විය.

ලංකා බැංකුව විසින් එතෙක් යෝර්ක් වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ලද රජයේ ගිණුම් වෙනම ශාඛාවක පවත්වාගෙන යාම සඳහා " තැප්‍රොබේන් ශාඛාව" නමින් නව ශාඛාවක් විවෘත කරන ලදි. ලංකා බැංකුවේ වාරියපොල හා පදවි (පරාක්‍රමපුර) යන කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 1994 වසර තුලදී "සී" ශ්‍රේණියට උසස් කරන ලදී. මෙම වසර තුල ලංකා බැංකුව විසින් අනුබද්ධිත කාර්යාල දෙකක් කොළඹ සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානයේ සහ මොරටුව සරසවිය තුල විවෘත කරන ලදී. 1994 වසර තුළදී ලංකා බැංකුව විසින් කොළඹ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු මධ්‍යස්ථානයක් විවෘත කරන ලදි. මේ අතර කොල්ලුපිටියේ මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානයේ පිහිටි ලංකා බැංකුවේ අනුබද්ධ කාර්යාලය වසා දමන

ලදි. මෙම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ලංකා බැංකුව සතුව තිබූ මුළු ශාඛා සංඛ්‍යාව 337ක් වූ අතර එයට ප්‍රධාන ශාඛා 262 ක්, කෘෂිසේවා මධ්‍යස්ථාන 27ක්, කච්චේරි ශාඛා 23 ක් අනුබද්ධිත කාර්යාල 23 ක් හා විදේශීය ශාඛා 2 ක් ඇතුලත් විය.

කරතිව් ශාඛාව නැවත විවෘත කිරීමට අමතරව මහජන බැංකුව විසින් නව ශාඛා 3ක් කුරුණෑගල (ඇතුගල්පුර) නුගේගොඩ (නගර ශාඛාව) සහ ගල්කිස්ස යන ස්ථානවල විවෘත කරන ලදි. මහජන බැංකුව විසින් 1994 උකස් මධ්‍යස්ථාන දෙකක්ද නුගේගොඩ හා මාතලේ යන ස්ථානවල විවෘත කරන ලදි. 1994 වසර තුලදී මහජන බැංකුව විසින් එම බැංකුවේ ත්‍රිකුණාමල වරාය ඇතුලත ශාඛාව වසා දමන ලදි. ඒ අනුව මහජන බැංකුවේ ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 323 දක්වාද උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 6 දක්වාද වැඩි වූ අතර අනුබද්ධිත කාර්යාල සංඛ්‍යාව නොවෙනස්ව පැවැතිණි.

හැටන් නැෂනල් බැංකුව මොණරාගල, කිරිබත්ගොඩ හා බොරැල්ල ශාඛා විවෘත කිරීමත් සමඟ එම බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 54 දක්වා වැඩි විය. හැටන් නැෂනල් බැංකුවේ ජංගම බැංකු (3) අනුබද්ධිත හා ගෙවීම් කාර්යාල (2) සංඛ්‍යාව වසර තුළ නොවෙනස්ව පැවැතිණි. සීමාසහිත ලංකා වාණිජ බැංකුව විසින් නව ශාඛා 3 ක් මිනුවන්ගොඩ, පානදුර, හා කොළඹ 1994 වසර තුළදී විවෘත කරන ලදි. මේ අනුව සීමාසහිත ලංකා වාණිජ බැංකුවේ ශාඛා සංඛ්‍යාව 34 දක්වා වැඩි විය. සම්පත් බැංකුව තම මුළු ශාඛා සංඛ්‍යාව 1994 වසර තුළ 18 දක්වා වැඩි කරමින් ශාඛා 3 ක් රත්මලාන, පිළියන්දල හා ඇහැලියගොඩ යන ස්ථාන වල විවෘත කරන ලදි. සෙලාන් බැංකුව නව ශාඛා 8 ක් වැලිමඩ, කොච්චිකඩේ, පිටකොටුව, බෙලිඅත්ත, මාලබේ, මතුගම, කොළඹ දකුණ හා වරකාපොල යන ස්ථානවල විවෘත කිරීම හා රද්දොළුගම (ගම්පහ), ගණේමුල්ල, වැලිවේරිය, කොටගල (නුවරඑළිය) සහ බගවන්තලාව යන ස්ථානවල පිහිටි ජංගම බැංකු මධ්‍යස්ථාන 5 ක් සම්පූර්ණ ශාඛා බවට උසස් කිරීමත් සමඟ 1994 දී මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 72 දක්වා ඉහළ නැංවිය. තවද, සෙලාන් බැංකුව විසින් මොරටුව මුදල් තැන්පත් කිරීමේ මධ්‍යස්ථානයක් හා මහරගම ආර්පිකෝ ප්‍රදර්ශනාගාරයෙහි අනුබද්ධිත කාර්යාලයක් විවෘත කරන ලදි.

1994 වසර තුළදී ඒ. එන්. ඉසෙඩ් ග්‍රින්ලේස් බැංකුව විසින් මහනුවර ශාඛාවක් විවෘත කරමින් තම ශාඛා ජාලය වර්ධනය කරන ලදි. හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව බොරැල්ලේ ශාඛාවක් විවෘත කළ අතර සී/ස හබීබ් බෑන්ක් ඒ. ජී. සූරිච් විසින් කොල්ලුපිටියේ පිහිටි තම මුදල් හුවමාරු ඒකකය පූර්ණ ශාඛා තත්ත්වයට උසස් කරන ලදී. මෙම එකතුත් සමඟ 1994 වසර අවසානය වන විට මුළු විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව 35 දක්වා වැඩි විය.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැං.) ශාඛා ජාලය 1994 වසරේදී තවදුරටත් පුළුල් විය. බදුල්ල ප්‍රා. ග්‍රා. සං. බැංකුව විසින් ශාඛා 4 ක් මීගහකිවුල, ලුනුගල, හල්දුම්මුල්ල හා ගිරාඳුරුකෝට්ටේ යන ස්ථානවල විවෘත කරමින් තම මුළු ශාඛා සංඛ්‍යාව 13 දක්වා ඉහළ නැංවීය. 1994 වසර තුළ ගම්පහ ප්‍රා. ග්‍රා. සං. බැං. හා කෑගල්ල ප්‍රා. ග්‍රා. සං. බැං. එක් ශාඛාව බැගින් විවෘත කරන ලදි. මේ නිසා 1993 වසරේ 163 ක්ව පැවැති ප්‍රා. ග්‍රා. සං. බැං. මුළු ශාඛා සංඛ්‍යාව 1994 වසරේදී 169 දක්වා වැඩිවිය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව (ජා. ඉ. බැ.) විසින් 1994 වසර තුළ නව ශාඛා 5 ක් කොටහේන, වව්නියාව, ත්‍රිකුණාමලය, බලන්ගොඩ හා කඹුරුපිටිය යන ස්ථානවල විවෘත කරන ලදි. ඒ අනුව1994 වසර අවසානය වන විට ජා. ඉ. බැ. සතුව තිබූ මුළු ක්‍රියාත්මක ශාඛා ගණන 90 ක් විය. ජාතික සංවර්ධන බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව යන ආයතනයන්හි කාර්යාල ජාලය නොවෙනස්ව පැවැති අතර 1994 දී ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය කුරුණෑගල නගරයේ ශාඛාවක් විවෘත කළේය.

ජංගම බැංකු මධ්‍යස්ථාන

ප්‍රා. ග්‍රා. සං. බැ. සහ රාජ්‍ය බැංකු දෙකද ඇතුලුව වාණිජ බැංකු කිපයක් විසින් බැංකු නොමැති හා ප්‍රමාණවත් බැංකු පහසුකම් නොමැති ප්‍රදේශවල ජනතාවගේ බැංකු අවශ්‍යතා සපුරාලනු පිණිස ජංගම බැංකු සේවා සැපයීම තවදුරටත් පවත්වාගෙන යන ලදි.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටුවීම

මහජන බැංකුව, ලංකා බැංකුව සහ සීමාසහිත ලංකා වාණිජ බැංකුව විසින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර පිහිටුවීම 1994 වසර තළදී තවදුරටත් පුලුල් කරන ලදි. මහජන බැංකුව විසින්

2.5 සංඛ්‍යා සටහන
බැංකු ආයතන පද්ධතියේ සංයුතිය සහ
ශාඛා වර්ගීකරණය 1990 -1994

වර්ගීකරණය	1990	1991	1992	1993	1994
1. ආයතන සංඛ්‍යාව	40	42	43	44	44
1.1 වාණිජ බැංකු	24	23	23	23	23
1.1.1 දේශිය	6	6	6	6	6
1.1.2 විදේශීය	18	17	17	17	17
1.2 ප්‍රා. ග්‍රා. සං. බැං. (අ)	12	15	16	17	17
1.3 ඉතිරිකිරීම් බැංකු	1	1	1	1	1
1.4 සංවර්ධන බැංකු ආයතන (සං. බැං. ආ.)	3	3	3	3	3
2. බැංකු ශාඛා සංඛ්‍යාව (ආ)	924	973	1,058	1,102	1,148
2.1 වාණිජ බැංකු ශාඛා	747	768	818	854	889
2.1.1 දේශීය වාණිජ බැංකු ශාඛා	724	743	789	821	853
(i) ප්‍රධාන ශාඛා	638	656	699	733	763
(ii) කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා	38	36	34	29	27
(iii) කච්චේරි ශාඛා	23	24	24	24	23
(iv) අනුබද්ධිත කාර්යාල/ගෙවීම් කාර්යාල/උකස් මධ්‍යස්ථාන*	23	25	30	33	38
(v) විදේශිය ශාඛා (ඇ)	2	2	2	2	2
2.1..2 විදේශිය බැංකු ශාඛා	23	25	29(ඈ)	33(ඈ)	36(ඈ)
2.2 ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛා	101	124	156	163	169
2.3 ජා. ඉ. බැං. ශාඛා	76	81	84	85	90
3. සංවර්ධන බැංකු ආයතන ශාඛා/කාර්යාල (ඉ)	6	7	7	6	7
3.1 ලංකා සංවර්ධන මුදල් සංස්ථාව	3	3	3	3	4
3.2 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2	3	3	2	2
3.3 ජාතික සංවර්ධන බැංකුව	1	1	1	1	1

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1985 අංක 15 දරණ ප්‍රා. ග්‍රා සං. බැං. පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රා. ග්‍රා. සං. බැංකු
(ආ) සමුපකාර ග්‍රාමීය බැංකු ඇතුලත් නොවේ.
(ඇ) ලංකා බැංකුවේ විදේශ ශාඛා 2 (ලන්ඩන් සහ මාලේ)
(ඈ) හොංකොං සහ ෂැංහයි බැංකුවේ උප - ශාඛා 3 ඇතුලත් වේ.
(ඉ) සංවර්ධන බැංකු ආයතනවල මූලස්ථාන කාර්යාල සහ ශාඛා ඇතුලත් වේ.
* මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ සම්පත් බැංකුවේ අනුබද්ධිත කාර්යාල/ ගෙවීම් කාර්යාල සහ උකස් මධ්‍යස්ථාන ඇතුළුව සංශෝධනය කරන ලදී.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 8 ක් නුවරඑළිය, රත්නපුර, ගම්පහ, මීගමුව, බොරැල්ල, මාතර, අනුරාධපුරය හා කොටුව දුම්රිය ස්ථානයේ සවිකරන ලදි. මේ අතරතුර ලංකා බැංකුව විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 6 ක් පැලියගොඩ, ඉඩම, කළුතර, මීගමුව, ගම්පහ ශාඛාවන්හි විශිෂ්ඨ ශ්‍රේණි ශාඛාවේ හා මහනුවර ශාඛාවන්හි සවිකරන ලදි. සීමාසහිත ලංකා වාණිජ බැංකුව විසින් 1994 වසර තුල ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 3 ක් නගර කාර්යාලය, මිනුවන්ගොඩ හා කෙයිසර් විදිය සවි කරන ලදී. සෙලාන් බැංකුව විසින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 6 ක් කොල්ලුපිටිය, නුගේගොඩ, පානදුර, කුරුඳුවත්ත,වැල්ලවත්ත යන ශාඛාවලත් සෙලාන් බැංකුවේ මූලස්ථාන කාර්යාලයේත් පිහිටුවන ලදි

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකු ආයතනයන් හි කටයුතු විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම දරයි. දෙපාර්තමේන්තුවේ මෙම වගකීම කාලීන පරීක්ෂා කිරීම් සහ ස්ථානීය නොවන අඛණ්ඩ අධීක්ෂණ මගින් ක්‍රියාත්මක කෙරේ. අධීක්ෂණ කාර්යයයේ ප්‍රධාන අරමුණ වන්නේ බැංකු ක්‍රමය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීමත්, තැන්පත් කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමත්ය.

1994 දී දෙපාර්තමේන්තුව මගින් වාණිජ බැංකු 12 ක ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු එකක ද පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලද අතර, මේවායින් ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ සහ වාණිජ බැංකු 05 ක පරීක්ෂණ නිම කරන ලදි. තවද, 1993 වසරේ දී අරඹන ලද වාණිජ බැංකු 06 ක පරීක්ෂණ කටයුතු ද 1994 දි නිම කෙරිණි. මීට අමතරව, ස්ථානීය පරීක්ෂණයන් හි පූර්වාරම්භයක් වශයෙන් ප්‍රාදේශීය ග්‍රාමිය සංවර්ධන බැංකු 04 ක ක්‍රියාකාරිත්වයේ ඇතැම් අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එතැන් පරීක්ෂණ කටයුතු සිදු කෙරිණ.

ස්ථානීය නොවන අධීක්ෂණ කටයුතු යටතේ දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වලත්, ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු වලත් මූල්‍ය තත්ත්වය එම බැංකු මගින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශ මත අඛණ්ඩව නිරීක්ෂණය කෙරිණි. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල කටයුතු ද මාසික පදනමක් මත නිරීක්ෂණය කෙරිණි. එක් එක් වාණිජ බැංකුවේ මෙන් ම සමස්ථ බැංකු කර්මාන්තයේ ම ලාභදායිත්වය සහ මූල්‍යමය ශක්තිය බැංකු මගින් සපයන ලද ආදායම් හා වියදම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශන මත ගණනය කොට අගය කෙරිණ.

1994 ඔක්තෝම්බර් මාසයේ දී දෙපාර්තමේන්තුව මගින් ස්ථානීය නොවන අධීක්ෂණ කටයුතු පරිගණක ගත කිරීම් ආරම්භ කෙරිණ. මේ සම්බන්ධව වාණිජ බැංකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශන වාර්තා කිරීමේ නව ආකෘතියක් හඳුන්වා දුනි.

බැංකු පනත යටතේ අදළ ව්‍යවස්ථාපිත නියමයන් සහ බැංකු වල විධිමත් අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අනෙකුත් උපදෙස් වාණිජ බැංකු මගින් නරයේ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි. මේවාට අවම ද්‍රවශීල වත්කම් සහ ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යැම, එක් ණයකරුවෙකුට දිය හැකි ණය සීමා පිළිපැදීම, අධ්‍යක්ෂ වරුන්ට සහ ඔවුන්ගේ පංගු කාරයින්ට අත්තිකාරම් සැපයීම පිළිබඳ සීමාවන් අනුගමනය කිරීම, ව්‍යවස්ථාපිත කාලපරිච්ඡේදයක් තුළ නියමිත ආකෘති වලට අනුව වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම අක්‍රීය ණය සඳහා පොළී අවිනිශ්චිත ගිණුමට මාරු කිරීම සහ බොල් සහ අඩමාණ ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීම යනාදිය ඇතුළත් විය.

1987 සිට ක්‍රියාත්මක වන තැන්පතු රක්ෂණ ක්‍රමය දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව පරිපාලනය කරන ලදි. ගෙවිය යුතු රක්ෂණ වාරිකය කාර්තුවකට රුපියල් සියයකට ශත 3.75 කි. ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වූ බැංකු පනතට අවශ්‍ය ප්‍රති සංශෝධන කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදි. අදළ යෝජිත සංශෝධන පාර්ලිමේන්තුවේ නීතියක් ලෙස සම්මත කර ගැනීමට යටත්ව දැනට ගැසට් කර ඇත. මෙකී යෝජිත සංශෝධන මගින් ලංකාවේ සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු වලට එක සමාන තරහ බිමක් ඇති කිරීමත්, වාණිජ බැංකු වල අක්වෙරළ කටයුතු වැනි මෙතෙක් විධිමත් පාලනයට යටත් නොවූ මූල්‍යමය කටයුතු දක්වා අධීක්ෂණ පථය පුළුල් කිරීමත්, මහ බැංකුවේ විධාන බලතල ශක්තිමත් කිරීමත්, දැනට බැංකු පනතේ රෙගුලාසි වලට යටත් නොවන සංවර්ධන බැංකු හා ඉතිරි කිරීමේ බැංකු ආයතනයන් හි කටයුතු සඳහා විධිමත් අවශ්‍යතා හඳුන්වා දීමත් අපේක්ෂා කෙරේ.

බැංකු නොවන මූල්‍ය ආයතන

ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචිකොට ඇති මූල්‍ය සමාගම්වල කටයුතු හැසිරවීම් සහ අධීක්ෂණය කිරීමේ කාර්යයන්හි මහ බැංකුව අඛණ්ඩව නියැලිණි. මෙම වසර තුළදී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මූල්‍ය සමාගම් පිළිබඳ ස්ථානීය පරීක්ෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමය තුළින් කරනු ලබන ස්ථානීය නොවන සුපරීක්ෂණයෙහි තවදුරටත් නියැලුණි.

මහ බැංකුවේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගම් 24 හි එකාබද්ධ ශේෂ පත්‍රවල දැක්වෙන පරිදි 1994 මාර්තු 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය තුළදී තැන්පතු වගකීම් ප්‍රමාණය සියයට 18.5 කින් වර්ධනය වූ අතර වර්ෂය තුළදී ලබාගත් ණය ප්‍රමාණය සියයට 4.4 කින් වර්ධනය විය. වර්ෂය සඳහා මූල්‍ය සමාගම්වල බොල් හා අඩමාණ ණය වෙන්කිරීම් පෙර වර්ෂයේ පැවති සියයට 106 ක වර්ධනය හා සසඳනකල සියයට 171 කින් වැඩිවිය. මෙම සැලකිය යුතු වැඩිවීමට මූලික හේතුව වූයේ මුදල් මණ්ඩලය විසින් 1991 දී නිකුත්කරන ලද අංක 2 දරණ බොල් හා අඩමාණ ණය වෙන්කිරීම් විධානයන්ය. ඒකාබද්ධ ශේෂපත්‍ර වල වත්කම් අංශය පෙන්වන පරිදි මුදල් වර්ෂය තුළ මූල්‍ය සමාගම්වල මුළු අත්තිකාරම් ද්‍රවශීල වත්කම ප්‍රමාණය සියයට 14.5 කින් වැඩි වූ අතර 1993 මාර්තු 31 දිනට මුළු වත්කම් වලින් සියයට 64 ක්ව පැවති අත්තිකාරම් ප්‍රමාණය සියයට 18.8 කින් ඉහළ නැගිණි. වැඩි විස්තර 2.6 සටහනෙහි දක්වා ඇත.

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ වර්ෂය තුළදි මූල්‍ය සමාගම් 24 කට මූල්‍ය කටයුතුවල නියැලීම පිණිස බලපත්‍ර නිකුත් කරන ලදි. ඒ සඳහා ට්‍රාන්ස්ලංකා ඉන්වෙස්ට්මන්ට් සමාගමට නිකුත් කර තිබූ බලපත්‍රය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන් නිරතුරුවම උල්ලංඝනය කිරීමේ හේතුවෙන් අවලංගු කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදි. දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන් සඳහා 1989 දි අරඹන ලද සහන යෝජනා ක්‍රමය මෙම වසර තුළදි ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම් 7 ක තැන්පතුකරුවන් වෙනුවෙන් වසරතුළදී කරන ලද සහනගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 37.7 ක් වූ අතර, 1994 වර්ෂය අවසානය දක්වා තැන්පතුකරුවන් වෙනුවෙන් කරන ලද මුළු සහන ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 511.5 ක් විය. මෙම සහන ගෙවීම් විශාල වශයෙන් බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය මගින් සිදු කරන ලදී. 1992 පෙබරවාරි මස මුදල් මණ්ඩලය විසින් පරිපාලනය හා කලමනාකරණය පවරා ගන්නා ලද එක් ලියාපදිංචි මූල්‍ය සමාගමකට, එහි තැන්පතු වගකීම් ගෙවීම් සඳහා වසර තුළදි රුපියල් දශලක්ෂ 220 ක ණය මුදලක් ලබා දෙන ලදී. 1994 දෙසැම්බර් අවසානය වන විට මෙම සමාගමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,315.7 ක් විය.

1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතට සංශෝධන කිහිපයක් සකස් කිරීමේ කටයුතුවල දෙපාර්තමේන්තුව නියැලී සිටියේය.

2.6 සංඛ්‍යා සටහන
ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍ර (රුපියල් දහස්)

		93. 03. 31 දිනට	94. 03. 31 දිනට	වෙනස ප්‍රතිශතයක් වශයෙන්
1.	**වගකීම්**			
1.1	ප්‍රාග්ධන අරමුදල්			
	නිකුත් කළ ප්‍රාග්ධනය	1,70,012	2,70,819	
	ප්‍රාග්ධන සංචිතය	4,55,065	5,71,541	
	පොදු සංචිතය	2,46,525	3,35,542	
	සංචිත අරමුදල	1,75,368	2,04,293	
	වෙනත් සංචිත	45,930	2,13,812	
	ලාභලාභ ගිණුමේ ශේෂය	17,625	41,994	
	දළ ප්‍රාග්ධන අරමුදල	11,10,525	16,38,001	
	අඩුකළා: විලම්බිත ගෙවුම්	107	124	
	ශුද්ධ ප්‍රාග්ධන අරමුදල	11,10,418	16,37,877	+ 47.50
1.2	බොල් හා අඩමාණ ණය වෙන්කිරීම	2,58,903	7,02,791	+ 171.45
1.3	මහජන තැන්පතු	49,86,693	59,07,935	+ 18.47
1.4	ණය			
	බැංකු	7,18,553	6,10,530	
	වෙනත්	29,724	1,70,899	
	මුළු ණය	7,48,277	781,429	+ 4.43
1.5	වෙනත් වගකීම්	9,51,104	11,50,360	+ 20.95
1.6	මුළු එකතුව	80,55,395	1,01,80,392	+ 26.38
2.	**වත්කම්**			
2.1	ද්‍රවශීල වත්කම්			
	අතැති මුදල් හා බැංකු ශේෂය	1,68,216	1,67,097	
	ස්ථාවර තැන්පත්	3,25,207	2,90,061	
	භාණ්ඩාගාර බිල්පත්	5,01,915	6,82,848	
	මුළු ද්‍රවශීල වත්කම්	9,95,338	11,40,006	+ 14.53
2.2	ආයෝජන			
	ආශ්‍රිත සමාගම් හා පාලිත සමාගම්වල කොටස්	1,19,347	1,88,043	
	වෙනත් සමාගම්වල කොටස්	4,28,298	8,02,539	
	අනුබද්ධ සමාගම්වල කොටස්	500	500	
	ණයකර	-	200	
	මුළු ආයෝජන	5,48,146	9,91,282	+ 80.84
2.3	අත්තිකාරම්			
	ණය	5,77,968	6,04,318	
	කුලී සින්නක්කර ණය	19,91,550	23,49,637	
	බදු සින්නක්කර ණය	4,72,892	20,98,211	
	කල් බදු ණය	16,33,504	5,24,644	
	ඉඩකඩම් ණය	2,00,614	2,63,528	
	වෙනත් අත්තිකාරම්	2,75,738	2,79,952	
	මුළු අත්තිකාරම්	51,52,266	61,20,290	+ 18.79
2.4	පාලිත හා ආශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු මුදල්	9,538	1,844	- 80.66
2.5	ස්ථාවර වත්කම්			
	ඉඩම් හා ගොඩනැගිලි	5,91,429	7,77,723	
	ගෘහ භාණ්ඩ සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	92,246	1,61,652	
	මෝටර් රථ	68,912	66,222	
	යන්ත්‍ර සූත්‍ර	33,993	12,460	
	වෙනත්	11,419	1,808	
	මුළු ස්ථාවර වත්කම්	7,97,999	10,19,871	+ 27.80
2.6	වෙනත් වත්කම්	5,52,109	9,07,099	+ 64.30
2.7	මුළු එකතුව	80,55,395	1,01,80,392	+ 26.38
	වාර්තා කළ සමාගම් ගණන	24	24	

සංවර්ධන මුදල්

1994 වර්ෂය තුළදී ද, සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ වගකීම් වූයේ එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (එ. ජ. ජා. සං. ආ.) යටතේ වන අඩු ආදායම් නිවාස වැඩ සටහනෙහි IV වැනි අදියර සඳහා වන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයට අමතරව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක) සඳහා වන ණය ආවරණ යෝජනා ක්‍රමය, බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය (බමිණ) හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙලට අදළ වැඩ කටයුතු තවදුරටත් ඉටු කිරීමය. මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි (මැ. දි. ණ. අ.) පරිපාලනමය කටයුතු, 1991 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවීමට පෙර එම පහසුකම් සපයන ලද ව්‍යාපෘතීන් ක්‍රියාකාරීත්වය (මූල්‍ය සමාගම් සඳහා ප්‍රදානය කළ ප්‍රතිමූල්‍ය හැර) පසු විපරම් කිරීමට පමණක් සීමාවිය.

ණය ආවරණ සහතික ක්‍රමයන්හි ක්‍රියාකාරීත්වය

1994 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරන ලද සුළු පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය (සු. පරි. ක.) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත I, II, III හා IV සඳහා වූ ණය ආවරණ සහතික ක්‍රමයන්හි සහ බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය යටතේ වූ ණය ආවරණ කටයුතු වල සාරාංශයක් පිළිවෙලින් අංක 2.7 හා 2.9 දරණ සංඛ්‍යා සටහන්හි දැක්වේ. සුමක II, III හා IV යන යෝජනා ක්‍රමයන් යටතේ මූල්‍ය පහසුකම් ලබාගත් ව්‍යාපෘතීන්හි කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයක් සංඛ්‍යා සටහන් අංක 2.8 හි දක්වා ඇත.

සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි.ක.) ණය යෝජනා ක්‍රමය

1978 වර්ෂයෙහි ක්‍රියාත්මක වීම ඇරඹුණු සු. පරි. ක. ණය යෝජනා ක්‍රමය අභිබවමින් 1979 වර්ෂයේ දි සුමක 1 ණය යෝජනා ක්‍රමය ඇරඹුණි. 1981 වර්ෂයේදී සු. පරි. ක. යෝජනා ක්‍රමය යටතේ ණය ආවරණ සහතික නිකුත් කිරීම සම්පූර්ණ කරන ලදි. මෙම යෝජනා ක්‍රමය යටතේ සහතික කරන ලද මුළු ණය මුදල් 767 කින් රුපියල් දශලක්ෂ 0.42 ක වටිනාකමකින් සහ රුපියල් දශලක්ෂ 0.3 ක ශ්‍රී ලංකා මහ බැංකු ණය ආවරණ වගකීමකින් යුක්ත ණය මුදල් 8 ක් 1994 වර්ෂය අවසානයේ දී ක්‍රියාත්මකව පැවතුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ වන හිමිකම් පෑම් මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ලබන අතර, එහිලා දැනටමත් රුපියල් දශලක්ෂ 1.7 ක් ගෙවා අවසන් කොට ඇත. දැනට ගෙවා අවසන් වී නොමැති ණය මුදල් 8 ට සම්බන්ධ හිමිකම් පෑම් අයදුම්පත් සියල්ල ඉදිරිපත් කරනු ලැබුවිට, ඒ සඳහා තවදුරටත් රුපියල් දශලක්ෂ 0.3 ක් මහා භාණ්ඩාගාරය විසින් ගෙවිය යුතු වේ.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - I (සුමක - I) යෝජනා ක්‍රමය

සුමක 1 ණය යෝජනා ක්‍රමය 1979 වර්ෂයේදී ඇරඹුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ 1979-1982 කාලපරිච්ඡේදය තුළදි රුපියල් දශලක්ෂ 286 ක් වටිනා ණය මුදල් ආවරණය වන පරිදි ණය සහතික පත්‍ර 1,670 ක් නිකුත් කර ඇත. ණය මුදල් 1,230 ක් 1994 වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන් ගෙවා ඇති අතර, රුපියල් දශලක්ෂ 31.4 ක වටිනාකමකින් යුක්ත ණය ආවරණ සහතික 113 ක්, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබිණි. මෙම කාලපරිච්ඡේදය තුළදී රුපියල් දශලක්ෂ 33.9 ක මුළු වගකීමක් සහිත හිමිකම්පෑම් 338 ක් ලැබුණු අතර, එයින් රුපියල් දශලක්ෂ 19.1 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 230 ක් සමථයකට පත් කරන ලදි. උතුරු නැගෙනහිර පළාත්වල අස්ථානගත වී ඇති, ගෙවීම් පැහැර හැර ඇති බව හෝ අසාර්ථක වී ඇති බව හෝ ප්‍රකාශ කරන ලද ව්‍යාපෘති වලට අදල ණය මුදල් සඳහා වන වගකීම් වලින් සියයට 50 ක අතුරු ගෙවීමක් කිරීමට ගනු ලැබූ තීරණයකට අනුව, එවැනි නොගෙවා හරින ලද ණය මුදල් 27 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 2.1 ක ගෙවීමක් සිදුකොට ඇත. රුපියල් දශලක්ෂ 2 ක වටිනාකමකින් යුත් හිමිකම් පෑම් 37 කට අදළ ණය මුදල්, හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශලක්ෂ 5.5 ක වටිනාකමකින් යුත් හිමිකම් පෑම් 30 ක් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි අනුගමනය නොකිරීම නිසා ප්‍රතික්ෂේප

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික යෝජනා ක්‍රමයන්

යෝජනා ක්‍රම සහ වර්ෂ	සුළු පරිමාණ කර්මාන්ත		සුමක I		සුමක II		
ශීර්ෂය	1994		1994		1993		19
	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව
1.1 ප්‍රදානය කරන ලද ණය	767	31.20	1,670	286.10	2,531	1,392.54	2,531
1.2 සහතික කරන ලද ණය	767	23.40 (ආ)	1,670	157.50 (ඇ)	2,531	713.63 (ඈ)	2,531
2.1 සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය	598	23.06	1,230	183.93	1,368	575.58	1,497
2.2 ඉවත් කර ගන්නා ලද ණය හෝ අවලංගු වූ ණය සහතික	90	4.89	113	31.38	340	167.37	341
හිමිකම්පෑම්							
3.1 ලැබූ මුළු හිමිකම්පෑම්	88	4.32 (උ)	338	75.89 (උ)	216	87.21 (උ)	225
3.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්		2.42		33.89		55.76	
3.3 හිමිකම්පෑම් සමථයකට පත්කිරීම්							
3.3.1 සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම් පෑම්	63	1.68	230	19.07	117	29.44	124
3.3.2 අර්ධ ගෙවීම් කළ හිමිකම්පෑම්	1	0.00 (ඌ)	27	2.11	4	0.67	4
3.3.3 ප්‍රතික්ෂෙප කළ හිමිකම් පෑම්	7	0.22	30	5.50	40	9.41	44
3.3.4 හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය(ඒ)	16	0.24	37	2.03	5	1.10	5
3.3.5 සලකා බැලීම කල් තබන ලද හිමිකම් පෑම්(ඔ)	1	0.27	11	2.64	24	7.51	26
3.3.6 තීරණ ගෙන නොමැති හිමිකම් පෑම් (ඔ)			3	0.51	19	2.99	15
3.3.7 ඉවත්කර ගන්නා ලද හිමිකම් පෑම් (ඔ)					7	3.62	7
4.1. නොපියවන ලද ණය මුදල්	8	0.42 (එ)	40	4.56 (එ)	662	203.51 (එ)	520
4.2 (එයින් හිඟහිටි ණය)	8	0.42	40	4.56	427	55.72	394
4.3 ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්	8	0.30 (ආ)	40	2.92 (ආ)	662	117.05 (අ)	520
5. රැස්කරණ ලද වාර මුදල		1.00		12.22		28.38	
6. පශ්වාත් හිමිකම් අයකර ගැනීම්		0.61		8.39		11.86	

(අ) ජාතික සංවර්ධන බැංකුව විසින් සුමක යෝජනා ක්‍රමය මාරු කරන ලද ණය මුදල් හැර
(ආ) නොපියවූ ණය ශේෂයන්ගෙන් සියයට 75 ක ප්‍රමාණය.
(ඇ) ව්‍යාපෘතියකට රුපියල් දශලක්ෂ 0.4 ක උපරිමයකට යටත්ව නොපියවූ ණය ශේෂයෙන් සියයට 60 ක ප්‍රමාණය
(ඈ) රුපියල් දශලක්ෂ 2.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශලක්ෂ 0.8ක් සහ රුපියල් දශලක්ෂ 2.0 - 4.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශලක්ෂ 1.2 ක උපරිමයකට යටත් වූ හිඟ ණය මුදල්හි සියයට 60ක ප්‍රමාණය.
(ඉ) ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශලක්ෂ 2.0, රුපියල් දශලක්ෂ 2.0-3.0 සහ රුපියල් දශලක්ෂ 3.0-4.-ක් වූ ණය සඳහා පිළිවෙලින් සියයට 80,60 සහ 40 ප්‍රමාණය.
(ඊ) ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශලක්ෂ 0.5, රුපියල් දශලක්ෂ 0.5-1.0, රුපියල් දශලක්ෂ 1.0-2.0 සහ රුපියල් දශලක්ෂ 2.0-8.0ක් වූ ණය සඳහා පිළිවෙලින් සියයට 90, සියයට 80, සියයට 70 සහ සියයට 60ක්
(උ) ගෙවීම් පැහැර හැර ඇති ණය මුදල් එකතු වූ පොළියත් සමග.
(ඌ) රුපියල් 4,504.75 ක හිමිකම්පෑම් ගෙවා ඇත.
(එ) අයකරගත් ණය වාරික හැර.
(ඒ) 2.1 යටතේ අඩංගු වී ඇත.
(ඔ) 4.1 යටතේ අඩංගු වී ඇත.

හි 1994 12. 31 දිනට පැවති සාරාංශය

(වටිනාකම රුපියල් දශලක්ෂ)

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක)

	සුමක III				සුමක IV			
94	1993		1994		1993		1994	
වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1,392.54)	3,130	1,955.59 (අ)	3,130	1,955.59 (අ)	4,899	3,477.03	6,270	4,735.90 (ඊ)
713.63 (ඇ)	3,130	1,312.62 (ඉ)	3,130	1,312.62 (ඉ)	4,899	2,102.03 (ඊ)	6,270	2,855.71 (ඊ)
677.84	505	183.85	1,000	439.89	19	13.74	253	125.52
167.90	252	195.19	267	202.09	52	32.69	169	103.76
115.51 (උ)	90	37.18 (උ)	124	61.55 (උ)	13	6.50 (උ)	40	25.54 (උ)
58.63		30.98		43.80		6.39		20.42
30.33	50	15.39	69	19.90	5	1.08	16	3.64
0.67								
11.67	16	5.49	24	7.43	1	0.16	3	0.43
1.10								
8.17	5	2.57	4	4.63	1	1.11	2	1.64
4.80	19	8.44	25	10.83	6	4.06	18	12.86
3.62			2	1.70			1	1.63
146.31 (එ)	2,307	872.88 (එ)	1,770	585.85 (එ)	4,822	1,801.26 (එ)	5,829	2,999.54 (එ)
68.17	748	80.89	567	108.00			509	51.47
84.31 (ඇ)	2,307	577.04 (ඉ)	1,770	386.81 (ඉ)	4,822	1,220.18 (ඊ)	5,829	1,951.68 (ඊ)
29.21		34.68		39.59		17.93		61.78
13.99		3.25		5.64		0.09		0.26

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.8 වැනි සංඛ්‍යා සටහන

සුමක II , III සහ IV ණය සහතික ක්‍රම කර්මාන්ත අනුව වර්ගීකරණය - 1994. 12. 31 දිනට

(වටිනාකම රුපියල් දහස්)

කර්මාන්ත	සුමක - II, III සහ IV 1982 - 1994						සුමක - IV 1994					
	ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව	%	ණය ප්‍රමාණය	%	සහතික කරන ලද ණය සංඛ්‍යාව	%	ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව	%	ණය ප්‍රමාණය	%	සහතික කරන ලද ණය සංඛ්‍යාව	%
1. ආහාර වර්ග සැකසීම	2,822	23.7	18,10,284	22.4	10,51,372	21.5	234	17.1	1,52,746	12.2	94,396	12.6
2. වෙනත් කෘෂිකර්මාන්ත	271	2.3	1,28,917	1.6	82,064	1.7	13	0.9	17,710	1.4	9,819	1.3
3. රබර් නිෂ්පාදන	241	2.0	2,43,393	3.0	135,113	2.8	19	1.4	21,949	1.8	12,155	1.6
4. ලෝහ නිෂ්පාදන	1,028	8.6	5,31,579	6.6	3,24,953	6.7	139	10.1	93,638	7.5	54,149	7.2
5. ඉදිකිරීම් ද්‍රව්‍ය	739	6.2	4,21,588	5.2	2,79,615	5.7	58	4.2	57,101	4.6	31,711	4.2
6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු	164	1.4	2,36,021	2.9	1,15,449	2.4	22	1.6	31,800	2.5	18,230	2.4
7. දැව කර්මාන්ත	722	6.1	3,29,467	4.1	2,25,481	4.6	79	5.8	53,907	4.3	35,538	4.7
8. ඇඟළුම්	760	6.4	6,59,272	8.2	3,69,200	7.6	52	3.8	62,790	5.0	32,231	4.3
9. රෙදිපිළි	273	2.3	2,77,597	3.4	1,49,014	3.1	39	2.8	35,085	2.8	20,829	2.8
10. අළුත්වැඩියා කිරීමේ වැඩපොළවල්	441	3.7	2,29,480	2.8	1,51,445	3.1	42	3.1	47,026	3.8	24,988	3.3
11. වෙනත්	4,470	37.5	32,16,573	39.8	19,98,242	40.9	674	49.2	6,77,686	54.2	4,15,893	55.5
එකතුව	11,931	100.0	80,84,171	100.0	48,81,948	100.0	1,371	100.0	12,51,438	100.0	7,49,940	100.0

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කරනලදී. හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව සහභාගිත්ව ණය දෙන ආයතන විසින් දියත් කරන ලද පුනරුත්ථාපන වැඩසටහන් කරණකොට ගෙන හෝ ණයකරුවන් විසින් ණය මුදල් ආපසු ගෙවීම් යළි ඇරඹීම නිසා හෝ රුපියල් දශලක්ෂ 2.6 ක් වටිනා හිමිකම් පෑම් 11 ක් සඳහා වන ගෙවීම් සලකා බැලීම් කල්දැමීමට සිදුවිය. 1994 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානය වන විට රුපියල් දශලක්ෂ 2.9 ක උපරිම ණය ආවරණ වගකීමක් සහිත, රුපියල් දශලක්ෂ 4.6 ක වටිනාකමකින් යුත් ණය මුදල් 40 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය හා පශ්චාත් හිමිකම් පෑම් ආපසු අයකිරීම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 12.2 ක් හා රුපියල් දශලක්ෂ 8.4 ක් විය. වාරික මුදල් ලැබීම් හා පශ්චාත් හිමිකම් පෑම් ආපසු අය කිරීම් වලින් සමන්විත වූ රුපියල් දශලක්ෂ 20.6 ක් වන මුළු සම්පත් ප්‍රමාණය මෙම යෝජනා ක්‍රමය යටතේ වූ වගකීම් පියවීම සඳහා ප්‍රමාණවත් නොවූ හෙයින් රුපියල් දශලක්ෂ 0.6 ක මුදලක් සිය අරමුදල් වලින් පියවීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - II (සුමක II) ණය යෝජනා ක්‍රමය

1982 වර්ෂයෙහි ක්‍රියාත්මක වීම ඇරඹුණු සුමක II ණය යෝජනා ක්‍රමය යටතේ 1989 වර්ෂය දක්වා ණය ආවරණ සහතික නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 714 ක උපරිම ණය ආවරණ වගකීමක් සහිත රුපියල් දශලක්ෂ 1,393 ක් වටිනා ණය මුදල් ප්‍රමාණයක් සඳහා ණය ආවරණ සහතික 2,531 ක් 1982 - 89 කාලපරිච්ඡේදය තුළදී නිකුත් කර ඇත. එයින් රුපියල් දශලක්ෂ 678 ක වටිනාකමක් ඇති ණය මුදල් 1,497 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 168 ක වටිනාකමකින් යුත් ණය ආවරණ 341 ක් ඉවත්කර ගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 59 ක වගකීමක් සහිත හිමිකම් පෑම් 225 ක් ලැබුණු අතර, එයින් රුපියල් දශලක්ෂ 30 වටිනාකමක් ඇති හිමිකම් පෑම් 124 ක් සමථයකට පත්කරන ලදී. දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත් වලින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑම් සඳහා ගෙවීම් කිරීම පිළිබඳව ගනු ලැබූ තීරණයකට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 නොඉක්මවන පරිදි හිමිකම් පෑම් 4 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 0.7 ක අතුරු දීමනාවක් ගෙවන ලද අතර, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 12 ක් වටිනා හිමිකම්පෑම් 44 ක් ප්‍රතික්ෂේප කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හිමිකම්පෑම් 5 කට අදාල ණය මුදල් ණයකරුවන් විසින් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශලක්ෂ 3.6ක වටිනාකමකින් යුත් හිමිකම් පෑම් 7 ක් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ඉවත් කර ගන්නා ලදී. සහභාගිත්ව ණය දෙන ආයතන විසින් පුනරුත්ථාපන වැඩසටහන් දියත් කිරීම හේතුකොට ගෙන හෝ හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ණය මුදල් ගෙවීම යළි ඇරඹීම හේතුවෙන් හෝ 1994 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 8.2 ක වටිනාකමකින් යුත් හිමිකම් පෑම් 26 ක් සලකා බැලීම පසුවට කල්තබන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වගකීම් රුපියල් දශලක්ෂ 84 ක් සහිත වූ රුපියල් දශලක්ෂ 147 ක වටිනාකමකින් යුත් ණය මුදල් 520 ක් 1994 වර්ෂය අවසානයේදී ක්‍රියාත්මකව පැවතුණි. එයින් රුපියල් දශලක්ෂ 68.2 ක වගකීමකින් යුත් ණය මුදල් 394 ක් හිඟහිටි ණය වශයෙන් වාර්තා වී ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ 1994 වර්ෂය අවසාන වනවිට රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය වන රුපියල් දශලක්ෂ 29.2 හි සහ ශ්‍රී ලංකා මහ බැංකුවට පශ්චාත් හිමිකම් පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් ලැබුණු රුපියල් දශලක්ෂ 14.0 හි එකතුව රුපියල් දශලක්ෂ 43.2 කි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත III (සුමක III) ණය යෝජනා ක්‍රමය

සුමක III ණය යෝජනා ක්‍රමය 1988 වර්ෂයේදී ඇරඹුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 1,956 ක වටිනාකමක් ඇති ණය මුදල් 3,130 කට ණය ආවරණ ලබාදී ඇත. 1991 වර්ෂයේදී ගන්නා ලද තීරණයකට අනුව, ආරම්භයේදී සුමක III ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද ණය මුදල් 754 ක් සුමක IV ණය යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබීය.

සුමක III ණය යෝජනා ක්‍රමය යටතේ දෙනු ලැබූ 3,130 ක් වන මුළු ණය මුදල් සංඛ්‍යාවෙන්

රුපියල් දශලක්ෂ 439.9 ක වටිනාකමක් ඇති ණය මුදල් 1,000 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 202.1 ක වටිනාකමකින් යුත් ණය මුදල් 267 ක් ඉවත්කර ගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1994 වර්ෂය අවසානය වනවිට රුපියල් දශලක්ෂ 43.8 ක ශ්‍රී ලංකා මහ බැංකු ණය ආවරණ වගකීමක් සහිත හිමිකම්පෑම් 124 ක් ලැබුණි. එයින් මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 19.9 ක් වූ හිමිකම් පෑම් 69 ක් සමථයකට පත්කරනු ලැබූ අතර, රුපියල් දශලක්ෂ 7.4 ක මුළු වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 24 ක් ප්‍රතික්ෂේප කරන ලදි. හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ඔවුන්ට අදල ණය ගිණුම් විධිමත් කිරීම හේතුවෙන් හිමිකම්පෑම් 4ක් සලකා බැලීම පසුවට කල්තබන ලදි. 1994 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් දශලක්ෂ 386.8 ක උපරිම ණය ආවරණ වගකීමක් සහිත රුපියල් දශලක්ෂ 585.8 ක වටිනාකමකින් යුත් ණය මුදල් 1,770 ක් ක්‍රියාත්මකව පැවතුණි. එයින් රුපියල් දශලක්ෂ 108 ක වගකීමක් සහිත වූ ණය මුදල් 567 ක් හිඟහිටි ණය මුදල් ලෙස වාර්තා වී ඇත. 1994 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 39.6 ක් වූ අතර, පශ්චාත් හිමිකම් පෑම් ආපසු අයකර ගැනීම් රුපියල් දශලක්ෂ 5.6 ක් විය.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - IV (සුමක IV) ණය යෝජනා ක්‍රමය.

1992 වර්ෂයේ මාර්තු මාසයේදී ඇරඹුණු සුමක IV ණය යෝජනා ක්‍රමය දැනුදු ක්‍රියාත්මක වේ. 1994 වර්ෂය අවසාන වනවිට රුපියල් දශලක්ෂ 4,736 ක වටිනාකමකින් යුත් ණය මුදල් 6,270 ක් සඳහා ණය ආවරණ සහතික නිකුත් කර ඇත. මෙම ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම රුපියල් දශලක්ෂ 2,856 ක් විය. මෙම වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 125.5 ක වටිනාකමක් ඇති ණය මුදල් 253 ක් සම්පූර්ණයත් ගෙවා නිම කරන ලද අතර, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් ණය ආවරණ 169 ක් ඉවත් කර ගැනීම හෝ අහෝසි වීම හෝ සිදුවිය. 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 2,999 ක මුළු වටිනාකමකින් යුත් ණය මුදල් 5,829 ක් ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතුණි. එම ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වගකීම රුපියල් දශලක්ෂ 1,952 කි. රුපියල් දශලක්ෂ 25.5 ක වටිනා කමක් ඇති හිමිකම්පෑම් 40 ක් 1994 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසාන වනවිට ලැබී තිබුණු අතර, එයින් රුපියල් දශලක්ෂ 3.5 ක වටිනාකමකින් යුත් හිමිකම් පෑම් 16 ක් සමථයකට පත්කරන ලදි. 1994 වර්ෂය අවසානයේදි මුළු ණය ආවරණ වාරික රැස්කිරීම රුපියල් දශලක්ෂ 61.8 ක් විය. මෙම වර්ෂය අවසානයේදි පශ්චාත් හිමිකම් පෑම් ගෙවීම් වශයෙන් රුපියල් දශලක්ෂ 0.3 ක් ලැබී තිබුණි.

බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය (බමිණ)

සහභාගිත්ව ණය දෙන ආයතන මගින් පෞද්ගලික බස්රථ ධාවකයින්ට පොදු මගී ප්‍රවාහනය සඳහා බස්රථ මිළදී ගැනීමට ප්‍රදානය කරන ලද ණය මුදල් ආවරණය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ණය ආවරණ සහතික ක්‍රමය 1990 වර්ෂයේ නොවැම්බර් මස හඳුන්වා දෙන ලදි. මෙම ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 1,099 ක වටිනාකමකින් යුත් ණය මුදල් 1,932 ක් සඳහා ණය ආවරණ ලබා දුනි. මෙම ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වගකීම් රුපියල් දශලක්ෂ 871 ක් විය. 1992 වර්ෂය අවසාන වනවිට බස්රථ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම සඳහා ජාතික සංවර්ධන බැංකුව වෙන්කර තිබූ සම්පත් සියල්ල ප්‍රයෝජනයට ගෙන තිබුණු හෙයින්, එතැන් සිට මෙම ණය ආවරණ සහතික ක්‍රමය ක්‍රියාත්මක වීම අවසන් විය.

බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය නව බස්රථ 1, 911 ක් පොදු මගී ප්‍රවාහනය සඳහා වන බස්රථ සමූහයට අළුතින් එක්කිරීමට උපකාරී විය. ණය පහසුකම් ලැබූ එක් බස්රථයක් පමණක් හිමි බස්රථ හිමියන් විශාල ප්‍රමාණයක් නියෝජනය කරමින් ණයකරුවන්, 1,816 දෙනෙකු සිටීම, මෙම යෝජනා ක්‍රමයෙහි එක් ලක්ෂණයක් විය.

1994 වර්ෂය අවසාන වනවිට රුපියල් දශලක්ෂ 140.8 ක වටිනාකමකින් යුත් ණය මුදල් 251 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා නිමකර තිබුණු අතර, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 68.5 ක වටිනාකමකින් යුත් ණය ආවරණ 116 ක් අහෝසි වීම හෝ ඉවත් කර ගැනීම හෝ සිදුවිය.

2.9 වැනි සංඛ්‍යා සටහන

බස්රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය - 1994 .12. 31 දිනට සාරාංශය

(වටිනාකම රුපියල් දශලක්ෂ)

ශීර්ෂය	1993. 12. 31 දිනට		1994. 12. 31 දිනට	
	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1.1 ප්‍රදානය කරන ලද ණය	1,932	1,098.58	1,932	1,098.58
1.2 සහතික කරන ලද ණය	1,932	871.18 (අ)	1,932	871.18 (අ)
2.1 සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති ණය	51	27.75	251	140.81
2.2 ඉවත් කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික	114	66.45	116	68.47
හිමිකම්පෑම්				
3.1 ලැබූ සම්පූර්ණ හිමිකම්පෑම්	6	3.71 (ආ)	13	7.59 (ආ)
3.2 මහ බැංකුවේ වගකීම්		2.33		6.33
3.3 සමථයකට පත් කරන ලද හිමිකම්පෑම්				
3.3.1 අඩක් සමථයකට පත්කරන ලද හිමිකම්පෑම්	3	0.69 (ඇ)	6	1.44
3.3.2 ප්‍රතික්ෂේපකරන ලද හිමිකම්පෑම්	1	0.60	2	1.00
3.3.3 කල් තබන ලද හිමිකම්පෑම් (ඉ)				
3.3.4 තීරණයක් නොගත් හිමිකම්පෑම් (ඉ)	2	0.81	4	2.53
3.3.5 හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය (ඊ)			1	0.42
4.1 ගෙවා නොමැති ණය	1,763	725.71 (ඈ)	1,557	420.53 (ඈ)
4.2 ගෙවා නොමැති ණය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්	1,763	574.60 (අ)	1,557	333.19 (අ)
5.0 රැස්කරන ලද වාර මුදල්		12.61		19.22
6.0 පශ්චාත් හිමිකම් අයකර ගැනීම්				0.52

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ව්‍යාපෘතියකට රුපියල් දශලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශලක්ෂ 2.0 රුපියල් දශලක්ෂ 2-3 සහ රුපියල් දශලක්ෂ 3 - 4 දක්වා වූ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් 80%, 60% සහ 40% ප්‍රමාණයන් මත.

(ආ) එහිදී අයකරගත් පොළිය ඇතුළත්ව, නොගෙවා පැහැර හරින ලද ණය ප්‍රමාණය.

(ඇ) සම්පූර්ණයෙන් සමථයකට පත්කරන ලදැයි දැක්වූ රුපියල් දශලක්ෂ 0.39 ක් වූ හිමිකම්පෑම් 2 ක් අඩක් සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබ ඇත.

(ඈ) අයකරගත් ණය වාරික හැර

(ඉ) අංක 4.1 යටතේ ඇතුළත් කරන ලදී.

(ඊ) අංක 2.1 යටතේ ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම රුපියල් දශලක්ෂ 6.3 ක් වූ රුපියල් දශලක්ෂ 7.6 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 13 ක් 1994 වර්ෂය අවසාන වන විට ලැබී තිබුණි. එයින් හිමිකම්පෑම් 6 ක් සඳහා රුපියල් දශලක්ෂ 1.4 ක් වන සියයට 50 ක අතුරු ගෙවීමක් කරන ලදි. 1994 වර්ෂය අවසාන වන විට රුපියල් දශලක්ෂ 2.5 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 4 ක් සලකා බලමින් පැවති අතර, රුපියල් දශ ලක්ෂ 1.0 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 2 ක් ප්‍රතික්ෂේප කරනු ලැබිය.

1994 වර්ෂය අවසාන වනවිට මෙම ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද මුළු වාරික ප්‍රමාණය රුපියල් දශලක්ෂ 19.2 ක්වූ අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් රුපියල් දශලක්ෂ 0.5 ක් ලැබී තිබුණි. 2.9 වැනි සංඛ්‍යා සටහන මගින් මෙම ණය ආවරණ සහතික ක්‍රමයෙහි ක්‍රියාකාරිත්වය සැකෙවින් දක්වා තිබේ.

අඩු ආදායම් නිවාස වැඩසටහන (අ. ආ. නි. වැ.) IV වැනි අදියර

1992 වර්ෂයෙහි ජූලි මාසයේදී ආරම්භ කරන ලද අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි IV වැනි අදියර, 1994 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන ණය දෙන ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාකරයි. එක්සත් ජනපද රජයේ නිවාස ණය වැඩසටහනෙහි IV වැනි අදියර මගින් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කරනු ලැබූ ණය මුදල් මගින් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමූල්‍ය ප්‍රදානය කරනු ලබයි. අඩු ආදායම් නිවාස වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුමකට එළඹ ඇති උප ප්‍රධාන ණය දෙන ආයතන (උ.ප්‍ර.ණ.ආ) හෝ සෘජු මූලික ණය දෙන්නන් (සෘ. මූ. ණ.) හෝ වශයෙන් නම් කර ඇති සහභාගිත්ව ණය දෙන ආයතන වලට මෙම අරමුදල් ලබාදෙනු ලැබේ. ලංකා බැංකුව, මහජන බැංකුව, සී/ස හැටන් නැෂනල් බැංකුව, සී/ස සෙලාන් බැංකුව, ජාතික උගස් හා ආයෝජන බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ කුරුණෑගල, මහනුවර, කෑගල්ල, පුත්තලම ගාල්ල සහ බදුල්ල යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මෙම යෝජනා ක්‍රමයෙහි උප ප්‍රධාන ණය දෙන්නන් ලෙස සහභාගී වේ. 1994 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ගම්පහ, මාතලේ සහ මාතර යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 ද මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදි. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා. නි. සං. අ.) ලංකා බැංකුව මගින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම, තිබෙන නිවාසයක් විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සහ දැනට තිබෙන නිවසක් අළුත්වැඩියා කිරීම ඇතුළත්ව, අයිතිකරු පදිංචි නිවසකට සම්බන්ධ ඕනෑම කාර්යයකට ණය පහසුකම් ප්‍රදානය කෙරේ. රු. 4,600/- ක් හෝ ඊට අඩු මාසික ආදායමක් ලබන කුටුම්භයන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබයි. එසේ වුවද මධ්‍ය ආදායම මසකට රු.5,700/- දක්වා වැඩි කිරීමට සැලකිල්ල යොමු කොට ඇත.

1994 වර්ෂය දක්වා මෙම අඩු ආදායම් නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද්දේ මහා භාණ්ඩාගාරයෙන් සපයන ලද රුපියල් දශලක්ෂ150 ක අත්තිකාරම් මුදලක් පදනම් කරගෙනය. මෙම යෝජනා ක්‍රමයෙහි ණය ගිවිසුමට අදල ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 25 ක ණය මුදලේ පළමුවැනි කොටස වශයෙන් ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 10 ක ණය මුදල 1994 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේදී ප්‍රදනය කරන ලදී. එම ණය අරමුදල් මෙම නිවාස වැඩසටහන යටතේ අනුමත කරන ලද ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් මුදහැරීම පිණිස උපයෝගී කරගනු ලැබීය.

අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි IV වැනි අදියරයෙහි ක්‍රියාකාරිත්වය අංක 2.10,2.11,2.12 සහ 2.13 යන සංඛ්‍යා සටහන් වලින් දක්වා ඇත.

1994 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ වන ණය මුදල් සඳහා රුපියල් දශලක්ෂ 338 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කරන ලද අතර, එයින් රුපියල් දශලක්ෂ 224 ක් මුදහරින ලදි. 1992 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේදයට අදල සමුච්චිත සංඛ්‍යා වලට අනුව, රුපියල් දශලක්ෂ 584 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කර ඇති අතර, රුපියල් දශලක්ෂ 360 ක් මුදහැර ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද ණය පහසුකම් වලින් විශාල ප්‍රමාණයක් භුක්ති විඳින ලැබ ඇත්තේ ග්‍රාමීය අංශයෙහි කුටුම්භයන් විසිනි. එහෙයින් 1993 සහ 1994 වර්ෂයන්හි සියයට 80 ක ණය ප්‍රමාණයක් අනුමත කර ඇත්තේ ග්‍රාමීය අංශයෙහි නිවාස කටයුතු උදෙසාය.

2.10 සංඛ්‍යා සටහන
අඩු ආදයම් නිවාස වැඩසටහන - IV වැනි අදියර
ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් හා මුදහැරීම්

රුපියල් දහස්.

උප ප්‍රධාන ණය දෙන ආයතන	අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය		මුදහරින ලද ප්‍රතිමූල්‍ය	
	1994	1992-94	1994	1992-94
1. ලංකා බැංකුව	1,34,811	3,09,562	89,106	1,88,564
2. සීමාසහිත ලංකා වාණිජ බැංකුව	510	1,357	687	903
3. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව	585	5,284	887	3,806
4. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	62,627	72,977	21,248	24,649
5. මහජන බැංකුව	99,086	1,34,877	87,762	1,10,662
6. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු	19,094	24,436	12,634	14,835
7. සීමාසහිත සෙලාන් බැංකුව	2,735	4,335	1,440	2,355
8. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	18,843	31,606	10,137	14,630
එකතුව	3,38,291	5,84,434	2,23,901	3,60,404

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.12 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදයම් නිවාස වැඩසටහන - IV වැනි අදියර
ණය අනුමත කිරීම් - පළාත් අනුව

පළාත	1994		1992 - 1994	
	ප්‍රමාණය (රු.000)	ප්‍රතිශතය	ප්‍රමාණය (රු.000)	ප්‍රතිශතය
1. මධ්‍යම	48,656	14.4	80,475	13.8
2. නැගෙනහිර	8,084	2.4	16,105	2.8
3. උතුරු මැද	56,737	16.8	1,43,350	24.5
4. වයඹ	29,180	8.6	48,150	8.2
5. උතුර	2,887	0.9	3,831	0.7
6. සබරගමුව	27,461	8.1	45,382	7.8
7. දකුණ	45,593	13.5	66,203	11.3
8. ඌව	7,221	2.1	16,623	2.8
9. බස්නාහිර	1,12,471	33.2	1,64,315	28.1
එකතුව	3,38,291	100.0	5,84,434	100.0

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.11 සංඛ්‍යා සටහන

අඩු ආදයම් නිවාස වැඩසටහන IV වැනි අදියර - ප්‍රගති සාරාංශය ණය අනුමත කිරීම්, සුදුසුකම් ලබන කාර්යයන් ,ආපසු ගෙවීමේ කාලය සහ ණය ප්‍රමාණය අනුව

රුපියල් දහස්

කාණ්ඩය	ණය අනුමත කිරීම්					
	1994			1992 - 1994		
	නාගරික	ග්‍රාමීය	එකතුව	නාගරික	ග්‍රාමීය	එකතුව
1. නව නිවසක් ගොඩනැගීම	23,850	1,24,845	1,48,695	48,608	2,42,434	2,91,042
2. වැඩිදියුණු කිරීම් සහ අළුත්වැඩියා කිරීම්	25,142	82,441	1,07,583	40,650	1,45,283	1,85,933
3. ඉඩමක් හිමිකර ගැනීම	20,089	60,781	80,870	24,782	80,842	1,05,624
4. පසුතල පහසුකම් ලබාගැනීම	200	944	1,144	310	1,526	1,836
එකතුව	69,281	2,69,010	3,38,291	1,14,349	4,70,085	5,84,434
ආපසු ගෙවීමේ කාලය අනුව						
අවු. 5 සහ ඊට අඩු	25,660	1,20,491	1,46,151	36,690	1,80,987	2,17,677
අවු. 6 සිට අවු. 10 දක්වා	18,349	76,744	95,093	35,853	1,76,112	2,11,964
අවු. 11 සිට අවු. 15 දක්වා	25,181	71,166	96,347	41,507	1,11,927	1,53,434
අවු. 16 සිට අවු. 20 දක්වා	90	610	700	299	1,059	1,358
ණය ප්‍රමාණය අනුව (රුපියල්)						
0. - 2,500	21	2,079	2,100	120	9,188	9,308
2,501 - 5,000	1,522	9,775	11,297	2,872	29,786	32,658
5,001 - 7,500	2,004	22,005	24,009	4,660	53,190	57,850
7,501 - 10,000	5,772	50,629	56,401	11,541	1,35,580	1,47,121
10,001 - 15,000	15,653	36,221	51,874	41,239	41,267	82,505
15,001 - 20,000	6,780	17,570	24,350	8,345	25,431	33,776
20,001 - 25,000	10,457	21,258	31,715	11,724	30,043	41,768
25,001 - 30,000	1,704	7,905	9,610	2,239	12,037	14,277
30,001 - 35,000	1,473	6,818	8,291	1,951	9,030	10,981
35,001 - 40,000	2,385	8,571	10,956	2,926	12,490	15,416
40,001 - 45,000	1,952	4,951	6,903	2,391	7,261	9,652
45,001 - 50,000	5,509	33,271	38,780	7,049	44,580	51,628
50,001 - 100,000	14,049	47,831	61,881	17,292	60,077	77,369
100,000 ට වැඩි	0	125	125	0	125	125
එකතුව	69,281	2,69,010	3,38,291	1,14,349	4,70,085	5,84,434

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව කරන ලද ණය වර්ගීකරණයට අනුකූලව ග්‍රාමීය අංශයෙහි ණයකරුවන් අතරින් පිළිවෙළින් සියයට 30 ක් හා සියයට 31 ක් කාන්තාවන් විය. ණය ලබාගැනීමට සුදුසුකම් ලබන කාර්යයන්ට අනුව කරන ලද වර්ගීකරණයට අනුව 1994 වර්ෂය තුළදී මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද ණය සංඛ්‍යාවෙන් සියයට 44 ක් පමණ නව නිවාස ගොඩනැගීම සඳහා ද, සියයට 32 ක් නිවාස වැඩිදියුණු කිරීම් හෝ අළුත්වැඩියා කිරීම් සඳහා ද, සියයට 24 ක් නිවාස තැනීම සඳහා ඉඩම් හිමිකර ගැනිම සඳහා ද උපයෝගි කරගෙන ඇත. 1992 සහ 1993 වර්ෂ වල ඉඩම් හිමිකර ගැනීම සඳහා ප්‍රදානය කරන ලද සියයට 10 ක් වන ණය මුදල් ප්‍රමාණය හා සසඳන කල 1994 වර්ෂයෙහි දී එම කාර්යය උදෙසා උපයෝගී කරගන්නා ලද සියයට 24 ක ණය ප්‍රමාණය විශාල වැඩිවීමක් පෙන්නුම් කරයි.

1994 වර්ෂය තුළ අනුමත කරන ලද ණය මුදල් සංඛ්‍යාවෙන් හතරෙන් පංගුවකට වඩා වැඩි ප්‍රමාණයක් රුපියල් 10,000/- ට හෝ ඊට වඩා අඩු ණය ප්‍රමාණයන්වූ අතර, සියයට 30 කට වඩා වැඩි ණය සංඛ්‍යාවක් රුපියල් 10,000/- ත් රුපියල් 25,000/- ත් අතර ණය කාණ්ඩයට අයත් විය. තවත් සියයට 30 ක ණය මුදල් සංඛ්‍යාවක් රුපියල් 45,000/= ත්, රුපියල් 100,000/= ත් අතර විය. පසුගිය වර්ෂය හා සසඳන කල අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් අනුමත කර ඇති ණය කොටසෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු. අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබාදුන් ණය කොටසෙහි අඩුවීමක් පෙන්නුම් කරනු ලැබිණි. එසේ වුවද, රුපියල් 25,000/= ට වඩා අඩු ණය මුදල් ලබාදෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මුළු ණය සංඛ්‍යාවෙන් සියයට 40 ක් සඳහා තවදුරටත් දයකත්වය දෙමින්, මෙම යෝජනා ක්‍රමය ඉතා අඩු ආදයම් ලබන කණ්ඩායම් සඳහා ණය ලබාදීමට ඇති වැඩි නැඹුරුව පිළිබිඹු කෙරිණි. 1994 වර්ෂයේදි මෙම වැඩපිළිවෙලෙහි ක්‍රියාකාරිත්වයෙහි ප්‍රමුඛ ලක්ෂණයක් වූයේ මූල්‍ය ආයතනයක් විසින් මෙම යෝජනා ක්‍රමයෙහිලා දැක්වූ බොහෝදුරට සමබර සහභාගිත්වයයි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය මුදල් සංඛ්‍යාවන්හි ණය ආපසු ගෙවීමේ කාල සීමා රටාව අනුව, සියයට 35 ක ණය මුදල් ප්‍රමාණයක් වසර 5 දක්වා වූ අතර, තවත් සියයට 35 ක් වසර 5-10 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ද, තවත් සියයට 25 ක් වසර 10-15 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ද විය.

සුමක සහ බ. ම. ණ. ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම

1988 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද සුමක හා බ. මි. ණ ණය සහතික ක්‍රමය යටතේ වූ අරමුදල් ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලෙහි ආයෝජනය කිරීම 1994 වර්ෂය තුළදී ද නොකඩවා ක්‍රියාත්මක කරන ලදි. 1994 වර්ෂය අවසානයේදි අරමුදල් සම්පත් සහ ඇප ආවරණ වාරික රැස්කිරීම් වල මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 561 ක් විය. ආයෝජනයන්ගෙන් 1994 වර්ෂයේ දි ලැබූ පොළී ආදයම රුපියල් දශලක්ෂ 88 කි.

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

විවිධ දිස්ත්‍රික්කයන්හි පවත්වනු ලබන විශේෂයෙන්ම සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් මගින් දැනට සිටින සුළු කර්මාන්ත කරුවන්ගේ තාක්ෂණික හා කළමනාකරණ කුසලතාවයන් වර්ධනය කිරීම ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙලෙහි අරමුණ වේ. ගම් මට්ටමෙන් ක්‍රියාත්මක වන විද්‍යුත් ආලේපනය කිරීම, යකඩ හා වානේ භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ආහාර සකස් කිරීම ආදී කර්මාන්ත අනු කාණ්ඩයන්හි යහපත සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබ ඇත. මේ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය ලෝක බැංකුව විසින් සුමක යෝජනා ක්‍රමය සඳහා ලබාදෙන කාර්මික ආධාර යටතේ 1993 වර්ෂයේ අග භාගයේදි අනුමත කරනු ලැබිණි. 1994 වර්ෂය තුළදී කළුතර දිස්ත්‍රික්කයේ පොතුපිටියෙහි දී කොහු ආශ්‍රිත ස්වයං රැකියාවන්හි නියුක්ත පුද්ගලයන් 40 දෙනෙකු උදෙසා පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. මෙම වැඩසටහන අපනයන ඉල්ලුම සපුරා ලීමට විශේෂ අවධානය යොමු කරමින් කළමනාකරණය හා කුසලතා වර්ධනය පිණිස සකස් කෙරුණි. 1995 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් 6 ක් සැලසුම් කර ඇත.

2.13 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදයම් නිවාස වැඩසටහන IV වැනි අදියර - ණය අනුමත කිරීම් ආංශික සංයුතිය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව

(රුපියල්)

වර්ෂය	එකතුව		ග්‍රාමීය අංශය				නාගරික අංශය			
			පුරුෂ		ස්ත්‍රී		පුරුෂ		ස්ත්‍රී	
	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1992	4,273	2,73,80,550	2,977	1,92,04,900	1,244	74,45,050	39	5,23,000	13	2,07,600
1993	23,718	21,87,62,075	13,865	12,30,27,075	6,193	5,13,97,300	2,321	2,88,41,000	1,339	1,54,96,700
1994	22,733	33,82,90,991	13,317	19,55,44,106	5,669	7,34,66,359	2,600	5,02,23,135	1,147	1,90,57,391
	50,724	58,44,33,616	30,159	33,77,76,081	13,106	13,23,08,709	4,960	7,95,87,135	2,499	3,47,61,691

මූලය : ශ්‍රී ලංකා මහබැංකුව

පසුවිපරම් කිරීම් සහ ව්‍යාපෘති පරීක්ෂණ

1994 වර්ෂය තුළදී ද ණය ප්‍රදානය කරනු ලැබූ ව්‍යාපෘතින්හි ශක්‍යතාවය හා ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරනු පිණිස සුමක ව්‍යාපෘති පරීක්ෂා කිරීම තවදුරටත් සිදු කරන ලදි. අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගැනීමේ අරමුණින් මෙන්ම සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑම් සමථයකට පත් කිරීම සඳහා, සුමක ණය ක්‍රමය යටතේ වූ ව්‍යාපෘති 131 ක් පරීක්ෂාවට ලක්කරනු ලැබිණි. මෙම ව්‍යාපෘති වලින් වැඩි සංඛ්‍යාවක් කොළඹ, පුත්තලම, ගම්පහ, අනුරාධපුරය, රත්නපුරය හා නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි ස්ථානගත වී තිබුණි.

ග්‍රාමීය ණය

1994 වර්ෂයේදීද, ශ්‍රී ලංකා මහ බැංකුව, කෘෂිකර්මාන්ත හා ග්‍රාමීය අංශයෙහි වර්ධනය සඳහා විදේශීය ආයතන මගින් අරමුදල් සපයන ලද පහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධව ණය මුදහැරීමේ මෙහෙයුම් ආයතනය වශයෙන් තවදුරටත් කටයුතු කළේය.

1. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (ඉෆ්පාඩ්) මගින් අරමුදල් සපයන ලද කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.

2. ආසියානු සංවර්ධන බැංකුව (ආ. සං. බැං.) මගින් අරමුදල් සපයන ලද කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය.

3. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද මැදරට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය.

4. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය.

5. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (ඉෆ්පාඩ්) සහ කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (සීඩා) මගින් අරමුදල් සපයන ලද සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය.

6. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.

7. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

වි. ගැ. හි දශලක්ෂ 1.55 ක ණය සහභාගයකින් යුත් කෑගල්ල දිස්ත්‍රික්කයෙහි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි ණය පහසුකම් සම්බන්ධ කටයුතු 1987 ඔක්තෝම්බර් 15 දින ආරම්භ කරන ලද අතර, 1994 දෙසැම්බර් මස 31 දින එහි කටයුතු අවසන් වීමට නියමිතව තිබුණි. කෙසේ වුවද පසුව මෙම ව්‍යාපෘතිය 1995 වසර අවසානය වන තෙක් දීර්ඝ කරන ලදි. රුපියල් දශලක්ෂ 90 (වි. ගැ. හි. දශලක්ෂ 1.55) වන මුදල් වෙන්කිරීම්වලින් 1994 අවසානය වන විට ව්‍යාපෘතිය යටතේ ඇති සියළුම අරමුණු සඳහා මුදහැර ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 75 කි. ඒ යටතේ කෙටිකාලින භෝග මෙන්ම මධ්‍යකාලින කෘෂිකාර්මික හා කර්මාන්ත සඳහාද ණය ලබාදී ඇත. කෙසෙල් වගාව, කිරිපට්ටි පාලනය හා ස්වයංරැකියා ව්‍යාපෘති සඳහා 1994 වසරේදී මෙම ව්‍යාපෘතිය යටතේ මුදහැර ඇති මුදල රුපියල් දශලක්ෂ 11.2 කි. ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 499 කි.

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව 1989 වර්ෂයේදී කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර සංවර්ධනය, පැල තවාන් සංවර්ධනය සහ කර්මාන්තශාලා සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 1994 වර්ෂයේදී සහභාගිවන ණයදෙන ආයතන මගින් මුදාහරින ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 47.2 ක් විය. මෙයින් ක්ෂේත්‍ර සංවර්ධනය (නැවත වගාව සහ නව වගාව) සඳහා රුපියල් දශලක්ෂ 24.7 ක්ද, පැල තවාන් සංවර්ධනය සහ කර්මාන්තශාලා සංවර්ධනය සඳහා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 7.8 ක් හා රුපියල් දශලක්ෂ 14.7 ක් ණය ප්‍රදානය කර ඇත. 1994 වර්ෂය තුළදී මෙම සියළුම අංශයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සපයන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 29 ක් විය. ණය මුදාහැරීම කඩිනම් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1993 දී ආරම්භ කරන ලද ණය ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩපිළිවෙල සම්මන්ත්‍රණ හා ණය කඳවුරු ව්‍යාපෘති ප්‍රදේශයේ සියළුම දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීම තුළින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙයට අමතරව තේ පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කර ඇති පරිදි ක්ෂේත්‍ර සංවර්ධන ණය සඳහා අවම සහන කාලයක් ලබාදීම සහ ක්ෂේත්‍ර සංවර්ධනයේදී සහනාධාර මගින් ආවරණය නොවන ව්‍යාපෘති පිරිවැය සඳහා ණය මුදල් ලබාගැනීමට හැකිවන පරිදි ණය මුදලේ ප්‍රමාණය වැඩිකිරීම වැනි සංශෝධන සමූහයක් ණය ක්‍රමයට ඇතුලත් කරන ලදී.

මැදරට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය

1994 වනවිට වසර හයක කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක වන නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ නිත්‍ය භෝග නිෂ්පාදනය වැඩිකිරීම හා එම භෝග වාණිජ වගාවක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා ගොවීන්ට ණය පහසුකම් ලබාදීමට සැලසුම් කර තිබේ. 1993 වර්ෂයේ මැද භාගයේදී ව්‍යාපෘතියේ සිදුකළ වෙනස්කම් සමගම ණය සඳහා වූ ඉල්ලුමේ සීඝ්‍ර වර්ධනයක් 1994 වසරේදී සිදුවිය. තවද ගොවීනට පහසු ලෙස ණය ලබාදීමේ අරමුණෙන් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා රත්නපුර යන දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ද අළුතින් ණය ලබාදෙන ආයතන වශයෙන් ඇතුළත් කර ගන්නා ලදී. 1994 වසර තුලදී පමණක් රුපියල් දශලක්ෂ 40 ක් මෙම යෝජනා ක්‍රමය යටතේ මුදාහැර ඇත. තවද 1994 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 75 ක් මුදාහැර ඇත.

කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය

කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ, උතුරු සහ නැගෙනහිර පළාත්වලත්, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, මොණරාගල සහ හම්බන්තොට යන ඊට යාබද දිස්ත්‍රික්ක පහේත් විපතට පත් පුද්ගලයන් හා හානියට පත් දේපළ පුනරුත්ථාපනය කිරීම පිණිස අවශ්‍ය ප්‍රාග්ධන අවශ්‍යතාවයන් මූල්‍යකරණය කිරීම සඳහා ණය පහසුකම් සැපයීමයි. කෘෂිකර්මය, සත්ව පාලනය, ධීවර කර්මාන්තය සහ කෘෂි-ව්‍යාපාර යන අංශයන් නගාසිටුවීම මගින් ගොවිපල නිෂ්පාදනය වැඩිකිරීමට දායකවීම සහ එය දීර්ගැන්වීමත්, රැකියා අවස්ථාවන් සහ ආදායම් ජනනය ව්‍යාප්ත කිරීමත් මෙම ව්‍යාපෘතිය මගින් ඉලක්ක කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ණය සැපයීම සඳහා 1991 වසරේදී මහ බැංකුවේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවෙහි පිහිටුවන ලද ව්‍යාපෘති පරිපාලන ඒකකය විසින් 1994 වසරේදී, ණයලාභීන් 2,597 ක් සඳහා රුපියල් දශලක්ෂ 146 ක ප්‍රතිමූල්‍ය ලබාදෙන ලදී. 1994 වසර අවසාන වන විට රුපියල් දශලක්ෂ 646 ක්වූ ප්‍රතිමූල්‍ය පහසුකම් ණය 13,163 ක් සඳහා ලබාදී තිබුණි. පසුගිය වසර දෙක තුළ ණය සඳහා පැවති දැඩි ඉල්ලුමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ණය සැපයුම, ව්‍යාපෘතිය යටතේ මුළු වෙන්කිරීම්වලින් සියයට 94 ක් විය. ණය ආපසු අයකරගැනීමද මෙම වසරතුලදීම ආරම්භ වූ අතර, එම අයකර ගැනීමද මෙම යෝජනා ක්‍රමය යටතේ මුල් වටයේදී මූල්‍ය පහසුකම් නොලැබූ ණය ඉල්ලුම්කරුවන් සඳහා ලබාදෙන ලෙස ව්‍යාපෘති පරිපාලන ඒකකය විසින් ණයදෙන ආයතනවලට උපදෙස් දෙන ලදී.

සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය (ඉසුරු) ව්‍යාපෘතිය

ඉසුරු ව්‍යාපෘතිය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) විසින් විගැහි. දශලක්ෂ 4. 8 ක ණයක් සහ කැනේඩියානු ජාත්‍යන්තර සංගමය (සීඩා) විසින් දශලක්ෂ 4.7 ක ප්‍රදානයක්ද සපයා ඇත. මෙම ව්‍යාපෘතිය ගාල්ල, මාතර, පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වේ. මහනුවර සහ පුත්තලම දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘති කටයුතු ඉෆාඩ් අරමුදල විසින් මූල්‍යකරණය කරනු ලබන අතර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘති කටයුතු සීඩා අරමුදල විසින් මූල්‍යකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රමුඛත්වයෙන් 1990 දි හඳුන්වාදෙනු ලැබූ මෙම ව්‍යාපෘතිය 1994 දී එහි කටයුතුවල පස්වැනි වසරට පිවිසුණි.

1994 අවසානයේදී මහනුවර සහ පුත්තලම දිස්ත්‍රික්ක දෙක සඳහා රුපියල් දශලක්ෂ 141 ක් වටිනා ණය 17,540 ක් හා ගාල්ල මාතර දිස්ත්‍රික්කවලට රුපියල් දශලක්ෂ 56.5 ක් වටිනා ණය 7,256 ක් අනුමතකරන ලදි. සීඩා සහ ඉෆාඩ් දිස්ත්‍රික්ක පිළිවෙලින් සියයට 85 ක සහ සියයට 91 ක සතුටුදායක ණය ආපසු අයකර ගැනීමේ අනුපාතයන් ලභාකර ගන්නා ලදී.

දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයන දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි කටයුතු 1992 වර්ෂයේදී ආරම්භ විය. ව්‍යාපෘති බලප්‍රදේශයේ ආදායම් හා රැකියා අවස්ථාවන් ජනනය කිරීම මගින් දකුණු පලාතේ ජනතාවගේ ආදායම් හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණකි. මේ අනුව දකුණ පළාතේ කාර්මික හා ස්වයංරැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට මූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

වි ගැ හි. දශලක්ෂ 6.4(ආසන්න වශයෙන් රුපියල් දශලක්ෂ 450) ක ණය මුදලක් වෙන්කර ඇති මෙම ව්‍යාපෘතියේ ණය පහසුකම් සැපයීමේ අධීක්ෂණ ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි. සංවර්ධන මූල්‍ය සංස්ථාව, ගාල්ල, මාතර, සහ හම්බන්තොට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහභාගි වන ණය දෙන ආයතන ලෙස සහභාගීවේ. වැලිගම වාර්ලිමවුන්ට් කාර්මික ජනපදයේ සුළු/මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන මූල්‍ය සංස්ථාව ණය දෙන ආයතනය වශයෙන් කටයුතු කරන අතර ග්‍රාමීය මට්ටමෙන් තෝරාගත් ණයකරුවන් සඳහා ස්වයං රැකියා ණය පහසුකම් ලබාදීම් ගාල්ල, මාතර සහ හම්බන්තොට ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකුවලින් සිදු කෙරේ. ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති (සණස) මෙම වර්ෂයේදී කණිෂ්ඨ කොටස්කරුවන් වශයෙන් ණය යෝජනා ක්‍රමයට ඇතුළත් කරගනු ලැබීය.

1994 වර්ෂයේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයිම ආරම්භ වූ අතර, ඒ අනුව ණයකරුවන් 2,129 ක් වෙනුවෙන් වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 31.5 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබීය.

වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

1994 වර්ෂය වයඹ පළාත ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය, මුළු වර්ෂය පුරා ක්‍රියාත්මක වූ පළමු වසර විය. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි ගොවි ජනතාවට සිය කෘෂිකාර්මාන්තයන් සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීම් පිණිස කෘෂි ළිං ඉදිකර ගැනිමටත්, සුළු පරිමාණ උත්සාන වාරිමාර්ග පහසුකම් සහ ප්‍රදේශයේ ග්‍රාමීය කාන්තාවන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් කුරුණෑගල හා පුත්තලම් ප්‍රදේශය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ හැටන් නැෂනල් බැංකුව ණය ලබාදෙයි. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී ඇති අරමුදල් ප්‍රමාණය විගැහි දශලක්ෂ 1.6 ක් (රුපියල් දශලක්ෂ 90 ක් පමණ) වේ. කෘෂි ළිං ඉදිකිරීමට සහනාධාර මුදල් ලබාදීම මගින් ශ්‍රී ලංකා රජය මෙම ණය යෝජනා ක්‍රමයට දායක වී ඇත.

1994 අවසානයේදී ස්වයං රැකියා 265 ක් සඳහා සහභාගිවන බැංකු විසින් රුපියල් දශලක්ෂ 5.1 ක් මුදහැර ඇත.

තේ වෙළෙඳුන්ට සහ තේ අපනයනකරුවන්ට විශේෂ මූල්‍ය පහසුකම්

1994 වර්ෂයේ මුල් භාගයේදී වෙළෙඳපොළෙහි පැවති අතිරික්ත තේ සැපයුම හේතුකොට

ගෙන තේ මිලෙහි සිදුවූ ක්ෂණික පහත වැටීම නිසා තේ වෙළෙඳුන්ට සහ අපනයනකරුවන්ට සහනයක් සලසාදීමේ ක්‍රමයක් 1994 මැයි මාසයේදී රජය විසින් හඳුන්වාදෙන ලදී. මෙම මූල්‍ය පහසුකම යටතේ 1994 මැයි 16 දින සිට ඉදිරියට පැවති තේ වෙන්දේසි 10 ක් තුළදී වෙළෙඳුන් හා අපනයනකරුවන් විසින් මිළදී ගන්නා අතිරික්ත තේ තොග සඳහා වර්ෂයකට සියයට 15ක පොළී ප්‍රමාණයකට මාස 6 ක කාලසීමාවක් සඳහා රුපියල් දශලක්ෂ 680 ක උපරිම දක්වා වාණිජ බැංකු මගින් සිය අරමුදල්වලින් ණය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම පහසුකම යටතේ වාණිජ බැංකුවලින් ලබාදෙන ණය මුදල් සඳහා රජය විසින් වාණිජ බැංකු වෙත වාර්ෂිකව සියයට 3.5 ක පොළී සහනාධාරයක් ගෙවීමට එකඟ වන ලදී. 1994 දෙසැම්බර් මස 31 වන දින වනවිට වාණිජ බැංකුවලින් තේ වෙළෙඳුන් හා අපනයනකරුවන් 18 දෙනෙක් වෙත රුපියල් දශලක්ෂ 287 ක මුදල් ප්‍රමාණයක් අතිරික්ත තේ මිළදී ගැනීම සඳහා ණය වශයෙන් ලබාදී ඇත. මේ සඳහා රුපියල් දශලක්ෂ 1 ක මුදල් ප්‍රමාණයක් පොළී සහනාධාර වශයෙන් ගෙවා ඇත.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැං.)

1994 දී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් (ප්‍රා. ග්‍රා. සං. බැං) ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ ප්‍රයත්නය තවදුරටත් කරගෙන යාමේ වැඩකටයුතු පුළුල් කරන ලදී.

ප්‍රා ග්‍රා. සං. බැංකුවල ශාඛා ව්‍යාප්තිය

1994 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 17 ක් විය. මුළු ශාඛා සංඛ්‍යාව 169 දක්වා වැඩිකරමින් බදුල්ල, කෑගල්ල සහ ගම්පහ ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් ශාඛා හයක් විවෘත කරන ලදී. ප්‍රා. ග්‍රා. සං. බැං. ශාඛා ව්‍යාප්තිය පිළිබඳ විස්තරයක් අංක 2.14 දරන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ඉතිරිකිරීම් සංචලනය

1993 සමඟ සසඳන කළ 1994 අවසානයේදී ප්‍රාදේශීය ග්‍රාමීය බැංකුවල තැන්පතු රාශිකරණය ගිණුම් 8,33,858 ක් සම්බන්ධයෙන් රුපියල් දශලක්ෂ 1,481 ක් වූ අතර, තැන්පතු වටිනාකම් අනුව සියයට 34 ක හා ගිණුම් සංඛ්‍යාව අනුව සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කළේය. මුළු තැන්පතු වටිනාකමින් රුපියල් දශලක්ෂ 1,254 ක් ඉතිරිකිරීමේ තැන්පතු වූ අතර, රුපියල් දශලක්ෂ 228 ක් ස්ථාවර තැන්පතු විය. 1993 වර්ෂය සමඟ සසඳන කළ මෙය පිළිවෙලින් සියයට 28 සහ සියයට 90 වැඩිවීමක් පෙන්නුම් කරයි. 1993 දී රුපියල් 1,381 ක් වූ ඉතිරිකිරීමේ ගිණුමක සාමාන්‍ය වටිනාකම 1994 දී රුපියල් 1,157 ක් දක්වාද 1993 දී රුපියල් 26,549 ක් වූ ස්ථාවර තැන්පතුවක සාමාන්‍ය වටිනාකම 1994 දී රුපියල් 30,366 දක්වාද වැඩිවිය. ශාඛා පද්ධතියේ ව්‍යාප්තිය, ආකර්ශනීය ඉතිරිකිරීමේ යෝජනා ක්‍රම දියත් කිරීම, බැංකු පහසුකම් අඩු සහ නොමැති ප්‍රදේශවල ජංගම සේවා පහසුකම් ඇති කිරීම සහ ග්‍රාමීය බැංකු කටයුතු ව්‍යාප්ත කිරීම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල තැන්පතු සංචලනයේ ප්‍රවර්ධනයට දායක වූ ප්‍රධාන හේතූන් විය.

ණය කටයුතු

ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් 1993 වර්ෂයේදී ණය 72,176 ක් සඳහා ලබාදුන් රුපියල් දශලක්ෂ 966 ට සාපේක්ෂව 1994 වසරේදී ණය 88,187 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 1,118ක් මුදහරින ලදී. මේ අනුව 1994 වර්ෂය තුළදී ලබාදුන් මුළු ණය මුදල් සියයට 16 කින් වැඩිවූ අතර, ණය ප්‍රමාණය සියයට 22 ක වැඩිවීමක් වාර්තා වී ඇත. කෙසේ වෙතත්, 1993 වර්ෂයේ රුපියල් 13,390 ක්වූ ණය සංඛ්‍යාව සාමාන්‍ය වටිනාකම 1994 වර්ෂය වන විට රුපියල් 12,680 දක්වා අඩුවිය.

1994 දී කෘෂිකාර්මික අංශය ණයමුදල්වල වටිනාකමින් සියයට 34 ක් ලබා ගත්තේය. වාණිජ, වෙළෙඳ, කුඩා කර්මාන්ත හා වෙනත් අංශවලට දෙන ලද ණය ප්‍රමාණය පිළිවෙලින් සියයට 19 ක් , සියයට 9 ක් හා සියයට 38 ක් විය. රන් භාණ්ඩ උකස් ණය වල සිදුවූ වර්ධනය 1994 වර්ෂය තුළ ප්‍රා. ග්‍රා. සං. බැංකුවල ණය මෙහෙයුම් කටයුතුවල කැපී පෙනෙන ලක්ෂණයක් විය. 1993 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 172 ක් වූ මෙම ණය 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 395 දක්වා වැඩිවිය.

අනෙකුත් කටයුතු

1994 වර්ෂය තුළදී ජනසවිය යෝජනා ක්‍රමය යටතේ ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් ණය ලබාදීම නොකඩවා සිදුකරන ලදී. 1994 වර්ෂයේ අවසානය වන විට ජනසවිලාභීන් වෙත ණය 20,029 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 118.8 ක් ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් ලබාදී ඇත.

ප්‍රා. ග්‍රා. සං. බැංකු විශේෂ ණය යෝජනා ක්‍රම කිපයක සහභාගිවන ණය දෙන ආයතන ලෙස දිගටම කටයුතු කරන ලදී. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමෙරිකා එක්සත් ජනපද නියෝජ්‍යායතනයෙහි අඩු ආදායම් නිවාස වැඩ සටහන, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය හා ඉසුරු ව්‍යාපෘතිය එම ණය යෝජනා ක්‍රම වේ. 1994 වර්ෂය තුළදී සියළුම ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් මෙම විශේෂ ව්‍යාපෘති යටතේ ලබාදුන් මුළු ණයවල වටිනාකම රුපියල් දශලක්ෂ 223 ක් විය.

මීට අමතරව 1994 වසර මුළුල්ලේ ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් ඔවුන්ගේ පුහුණු වැඩ සටහන් තුළින් මෙන්ම "ජනහමු" මගින් පුරුදු සහ ඵලදායී ව්‍යාපෘතීන් සඳහා ලබාගත හැකි බැංකු පහසුකම් පිළිබඳව ග්‍රාමීය අංශය දැනුවත් කිරීම තවදුරටත් කරගෙන යන ලදී. එමෙන්ම ප්‍රා. ග්‍රා. සං. බැංකු ඔවුන්ගේ ගණුදෙනුකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම හා ගබඩා කිරීම සඳහා අවශ්‍ය සහායද අඛණ්ඩව සපයන ලදී.

2.14 සංඛ්‍යා සටහන

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා ව්‍යාප්තිය

ප්‍රා.ග්‍රා.සං. බැංකුවෙ නම	ප්‍රාදේශීය ග්‍රා.සං. බැංකුව ආරම්භ කළ දිනය	ප්‍රධාන කාර්යාලය	විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව										
			1985	1986	1987	1988	1989	1990	1991	1992	1993	1994	1994 අවසානයට එකතුව
1. කළුතර	85.07.13	බුලත් සිංහල	4	3	4	1	-	-	1	2	-	-	15
2. මාතර	85.07.28	මාතර	5	2	-	1	-	-	-	4	-	-	12
3. කුරුණෑගල	85.08.10	කුලියාපිටිය	6	4	2	1	1	1	-	2	-	-	17
4. අනුරාධපුරය	85.08.12	අනුරාධපුරය	2	4	1	-	-	-	3	1	-	-	11
5. හම්බන්තොට	86.12.13	අම්බලන්තොට	-	2	2	2	-	1	-	1	-	-	8
6. කෑගල්ල	87.02.08	කෑගල්ල	-	-	8	1	2	1	(1)	1	1	1	14
7. පුත්තලම	87.07.11	හලාවත	-	-	5	1	-	2	1	1	-	-	10
8. ගාල්ල	87.08.17	ඇල්පිටිය	-	-	1	7	1	-	-	3	-	-	12
9. මහනුවර	87.10.13	මහනුවර	-	-	6	3	-	2	-	2	-	-	13
10. නුවරඑළිය	88.10.10	නුවරඑළිය	-	-	-	1	3	2	-	2	-	-	8
11. මොණරාගල	88.10.11	බුත්තල	-	-	-	1	2	1	2	-	-	-	6
12. බදුල්ල	90.10.13	බදුල්ල	-	-	-	-	-	4	2	3	-	4	13
13. පොළොන්නරුව	91.05.17	පොලොන්නරුව	-	-	-	-	-	-	4	2	1	-	7
14. මාතලේ	91.06.21	මාතලේ	-	-	-	-	-	-	5	1	-	-	6
15. රත්නපුරය	91.09.30	රත්නපුරය	-	-	-	-	-	-	4	2	1	-	7
16. අම්පාර	92.02.24	අම්පාර	-	-	-	-	-	-	-	5	2	-	7
17. ගම්පහ	93.06.07	ගම්පහ	-	-	-	-	-	-	-	-	2	1	3
එකතුව			17	15	29	19	9	14	21	32	7	6	169

මූලයයන් : ශ්‍රී ලංකා මහ බැංකුව

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය (ග්‍රා. බැ. සහ මා. අ. වි.) 1994 වසර තුළ පුහුණු පාඨමාලා 50 ක් පුද්ගලයන් 1,074 ක් සඳහා පවත්වන ලද අතර 1993 වසරේදී පුද්ගලයන් 1,111 ක් සඳහා පුහුණු වැඩසටහන් 51 ක් පවත්වා ඇත. 1994 වර්ෂය තුළ පැවැත්විමට නියමිත ව තිබූ පුහුණු පාඨමාලා සංඛ්‍යාව 50 ක් වූ අතර එයින් 46 ක් අභ්‍යාස විද්‍යාලයේදී ඉතිරි පාඨමාලා 4 පිට පළාත්වල ද පවත්වන ලදි.පිටපලාත්වල පැවැත්වූ පුහුණු පාඨමාලාවලට සහභාගී වූවන්ගෙන් වැඩිදෙනෙකු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් සපයන ලද ණය පහසුකම් දැනටම ලබාගත් හෝ එම බැංකුවලින් දෙනුලබන ණය පහසුකම් අපේක්ෂිත සුළු පරිමාණ ව්‍යවසායකයින් හා ස්වයං රැකියාවල නියුක්ත වූවන්ය. මේ පුහුණු පාඨමාලාවලට පුද්ගලයින් 1,074 ක් සහභාගි වූ අතර, එයට 442 දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ද, 260 දෙනෙකු වාණිජ බැංකුවලින් ද, 199 දෙනෙකු ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු වලින් ද, 79 දෙනෙකු අනිකුත් ආයතනවලින් ද, එක් වූ අතර සුළු පරිමාණ ව්‍යවසායකයින් හා ස්වයංරැකියාවල නියුක්ත ව්‍යාපෘතිවලින් 94 දෙනෙකුද ඇතුළත් විය.

ග්‍රාමීය බැංකු කටයුතු, ව්‍යාපෘති ආශ්‍රිත සංවර්ධනය, වාණිජ බැංකු කටයුතු, ජාත්‍යන්තර වෙළෙඳාම, විදේශීය විනිමය මෙහෙයුම් කටයුතු, කළමනාකරණ සංවර්ධනය, පුහුණුකරුවන් පුහුණු කරවීම සහ පරිගණක භාවිතය වැනි ක්ෂෙත්‍රයන්ට අදාල නියමිත පාඨමාලාවලට අමතරව කලින් සැලසුම් නොකළ පාඨමාලා කිහිපයක් ද ග්‍රා. බැ. සහ මා. අ. වි. මගින් 1994 වර්ෂයේ දී පවත්වනු ලැබි ය. මෙම පාඨමාලා ආයෝජන බැංකු කටයුතු, කොටස් වෙළෙඳපොල මෙහෙයවුම් කටයුතු සහ මුල්‍ය අංශයේ සංවර්ධනයන් යන ක්ෂෙත්‍රයන් හා සම්බන්ධ විශේෂ පුහුණු පාඨමාලාවන් වේ.

ආසියා ශාන්තිකර ග්‍රාමීය සහ කෘෂිකර්මාන්ත ණය සංවිධානයට (ඇප්‍රකා සංවිධානයට) අයත් සාමාජික ආයතනයන්හි මධ්‍ය/ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ක්ෂෙත්‍රයන්හි නිරත කලමනාකරුවන් සඳහා ග්‍රා. බැ. සහ මා. අ. වි. විසින් එහි ප්‍රථම ජාත්‍යන්තර පාඨමාලාව වන "කළමනාකරණ සංවර්ධන" පාඨමාලාව පවත්වන ලදි. තවද, සංචිත කළමනාකරණය පිළිබඳ නැගෙනහිර ආසියාතික මහ බැංකු (සියැසන්) සම්මන්ත්‍රණය පැවැත්වීම පිණිස ද ග්‍රා. බැ. සහ මා. අ. වි. සහයෝගය ලබා දෙන ලදි.

ස්වයං පිවිසුම් අධ්‍යයන මධ්‍යස්ථානය (ස.පි.ම.) සමඟවූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණාගාරය 1994 වර්ෂයේ අප්‍රේල් 28 වන දින ක්‍රියාත්මක කරන ලද අතර මහ බැංකු සේවකයින් 358 දෙනෙකු සඳහා ඉංග්‍රිසි භාෂාව පිළිබඳ දැනුම දියුණු කරලිම සඳහා පහසුකම් සපයන ලදි.

මහ බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයකු වූ ද, වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ සමුළුවේ හිටපු මහ ලේකම් වූ ද ආචාර්ය ගාමිණී කොරයා මහතා විසින් ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ 13 වන සංවත්සරය නිමිත්තෙන් " සංවර්ධන පර්යාලෝකයන්" යන තේමාව යටතේ දේශනයක් පවත්වන ලදී.

සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානයන් අනුව එම අරමුදලට කෙරෙන දායක මුදල් සහ අධිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේව්‍යයන්ගේ හා ඒ ඒ සාමාජිකයින්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වා ගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීම් යන වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ දෙපාර්තමේන්තුව පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමඟ සමීප සහයෝගීතාවයකින් යුතුව මෙම කටයුතු කරගෙන යනු ලැබේ.

දායක මුදල්

1993 වර්ෂයේ දි ලැබූ රුපියල් දශලක්ෂ 6,610.9 හා සසඳා බලන කල 1994 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,405.7 ක් විය. මෙය කලින් වර්ෂයේ ලද දයක මුදල් මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 794.8 ක හෙවත් සියයට 12 ක වැඩි වීමකි.

සාමාජිකයින්ගේ ශේෂ

විශ්‍රාමට ලක්වන වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1994, දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 75,731.2 ක්ව පැවැති අතර, එය 1993 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 13,306.2 ක හෙවත් සියයට 21.3 ක වැඩි වීමකි.

ආයෝජන

1993 වර්ෂයේ ආයෝජනය කල රුපියල් දශලක්ෂ 30,430.5 සමඟ සසඳ බලන කල සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී අරමුදල මගින් රජයේ සුරකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි, චක්‍ර සමාගම් ණයකර වල සහ ප්‍රති මිලදී ගැනිම් ගිවිසුම්වල ආයෝජනය කරන ලද මුදල රුපියල් දශලක්ෂ 37,609.2 කි. මෙය 1993 දී පැවැති ආයෝජන මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 7,178.7 ක වැඩි වීමකි. 1994 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 81,053.4 ක් වූ අතර, එය 1993 මුළු ආයෝජන මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 14,521.1 ක වැඩි වීමකි.

ආයෝජන වලින් ලැබූ ආදයම

1989 දේශීය ආදයම් පනතේ සංශෝධනයකට අනුව. සේ.අ.අ.ට දෙන ලද ආදයම් බදු නිදහස ඉවත් කරන ලදි. මේ අනුව 1989 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මගින් උපයන ආදයම සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට සහ ආදයම් බද්ද මත සියයට 15 අධිභාරයකට යටත් වේ. 1994 වර්ෂය සඳහා ආයෝජන ආදයම් වෙනුවෙන් අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද රුපියල් දශලක්ෂ 1,139 ක් වූ අතර, ආදයම් බද්ද මත අධිභාරය රුපියල් දශලක්ෂ 170.8 ක් විය.

1993 වර්ෂයේ ආයෝජන මගින් ලැබූ රුපියල් දශලක්ෂ 9,159.6 සමඟ සසඳා බලන කල 1994 වර්ෂයේදී ආයෝජන මගින් ලද ආදයම රුපියල් දශලක්ෂ 2,231.1 ක වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 11,390.7ක් විය.

2.15 සංඛ්‍යා සටහන
සේවක අර්ථසාධක අරමුදල් සංඛ්‍යාත 1993-1994

		1993	1994
1.	ලැබුණු දයක මුදල් (රුපියල් දශලක්ෂ)	6,610.0	7,405.7
2.	ආයෝජන (අ) "	30,430.5	37,609.2
3.	ආයෝජන වලින් ලද ආදයම "	91,59.6	11,390.7
4.	ප්‍රතිලාභ ආපසු ගෙවීම් "	2,377.3	2,630.1
5.	ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව	51,343	49,986
6.	පොළී අනුපාතිකය (සියයට)	13.5	12.75
7.	සාමාජික ශේෂයන් සඳහා පොළී ප්‍රතිපාදන (රු. ද.)	8,427.3	9,655.7
8.	ආයෝජන ආදයම මත රඳවා ගැනීමේ බදු (රු. ද.)	922.4	1,139.0
9.	ආදයම් බද්ද මත අධිභාරය (රු. ද.)	138.3	170.8

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රජයේ සුරකුම්පත්වල ප්‍රති-ආයෝජනය කළ කල් පිරුණු ප්‍රේෂණ ඵලයන් හා කෙටිකාලින හා ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙ, සහ ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළ සහ ප්‍රති මිලදී ගැනිම් ගිවිසුම්වල ආයෝජනය කල මුදල් ද ඇතුලත්ය.

ප්‍රතිලාභ ආපසු ගෙවීම

1993 වර්ෂය තුළදී සාමාජිකයින්ට සේ අ.අ. ප්‍රතිලාභ ආපසු ගෙවීම් වශයෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 2,377.3 ක් වූ අතර, එය 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 2,630.1ක් විය. මෙය රුපියල් දශලක්ෂ 252.8 කින් හෙවත් සියයට 10.6 ක වැඩි වීමකි. 1993 වර්ෂයේදී ගෙවා නිම කරන ලද 51,343 ක් වූ ප්‍රතිලාභ හා සසඳන කල 1994 වර්ෂය තුළදී 49,986 ක ඉල්ලුම් සඳහා ප්‍රතිලාභ ගෙවීම් කරන ලදී.

සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා වූ පොළිය

සේවක අර්ථසාධක අරමුදල මගින් සෑම වර්ෂයකම අවසානයේ සාමාජිකයින්ගේ ගිණුම් වල ඇති ශේෂයන් සඳහා අරමුදලේ ආයෝජනයන් මගින් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1994 වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා ගෙවිය යුතු වූ පොළී අනුපාතය වසරකට සියයට 12.75 ක් විය. මෙය 1993 වර්ෂයේ පොළී මට්ටමට වඩා ප්‍රතිශතක 0.75 ක අඩුවීමකි.

වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති සමුච්චිත ශේෂයන් සඳහා පොළී ගෙවනු ලැබේ. සාමාජික මුදල ලැබූ දිනය නොසලකා, වර්ෂය තුළ ලද සියළුම දායක මුදල් වෙනුවෙන් මුළු වර්ෂය සඳහාම පොළී හිමිවේ. උදාහරණයක් වශයෙන් වසරේ දෙසැම්බර් මාසයේදී ලැබුණු දායක මුදල් වලට ද, එම වර්ෂයේ ජනවාරි මාසයේ ලැබුණු දායක මුදල් වලට මෙන්ම මුළු වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එම නිසා මෙම අරමුදල් ශේෂ වලට ගෙවන සඵල පොළී අනුපාතිකය තරමක් දුරට ඉහළ මට්ටමක පවතී.

සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය

සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති ශේෂයන්ගෙන් සියයට 75 ක් දක්වා ආවරණය වන පරිදි නිවාස තැනීම් කටයුතු වෙනුවෙන් තෝරාගත් ණය දෙන ආයතන වලින් ණය ලබාගත හැකි වන පරිදි 1988 අංක 42 දරණ පනතින් සේ.අ.අරමුදල් පනත සංශෝධනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා සහභාගී වන ණය දෙන ආයතන වනුයේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ රට තුළ විසිරී පවතින විවිධ සේවා සමුපකාර සමිතින්ය.

1994 දෙසැම්බර් 31 දින වන විට සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ශේෂයන් තහවුරු කිරීම සඳහා ලැබුණු මුළු අයදුම් පත් සංඛ්‍යාවෙන් අයදුම්පත් 53,540 ක කටයුතු අවසාන කොට අදාල කම්කරු කාර්යාලයන් වෙත යවන ලදී.

1993-1994 වර්ෂයන්හි අරමුදලෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව සංසන්දනාත්මක දත්ත 2.15 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

විනිමය පාලන

1994 මාර්තු මස 15 වන දින ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි VIII වන වගන්තියෙහි 2, 3 හා 4 වන කාණ්ඩ පිළිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් විනිමය පාලන නීතිරීති ලිහිල් කිරීමට පියවර ගැනිණි. සියළුම ජංගම ගිණුම් කටයුතු සඳහා බාධාවකින් තොරව විදේශීය විනිමය නිකුත්කිරීමට 1994 මාර්තු 18 දිනැති ක්‍රියාකාරී උපදෙස් අනුව බලයලත් නියෝජිතයන්ට අනුමැතිය ලබා දී ඇත.

අපනයන

1953 අංක 24 දරන විනිමය පාලන පනතේ 22(4) කාණ්ඩයේ වගන්ති ප්‍රකාර, අපනයනකරුවන් මත පනවා තිබූ පවාරණ අවශ්‍යතාවයන් ඉවත් කරන ලදී. විනිමය පාලන පනතේ 6(2)(අ) කාණ්ඩය යටතේ බලය ලත් ගණුදෙනුකරුවෙකුට අපනයන කටයුතු සඳහා අවශ්‍යව තිබූ පවාරණ අවශ්‍යතා වලින් අපනයනකරුවන් නිදහස් කරනු ලැබිණි. ඒ අනුව අපනයනකරුවන්ට තම අපනයන ලැබීම් සිය රටට ගෙනැවිත් ශ්‍රී ලංකාවෙහි රුපියල් ගිණුම් හෝ විදේශීය මුදල් ගිණුම් ලෙස පවත්වා ගැනීමට හෝ විදේශ රටවල වාණිජ බැංකුවල විදේශ මුදල් ගිණුම් මගින් පවත්වා ගැනීමට හෝ හැකිය.

අපනයනකරුවෙකු භාණ්ඩ අපනයනය කිරීමේදී විනිමය පාලක වෙතින් ලබාගත යුතුවූ බලපත්‍ර අවශ්‍යතාවයන් 1994 අප්‍රේල් 7 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 183/14 දරණ ගැසට් නිවේදනයෙන් ඉවත් කරන ලදී.

පරිවර්ත්‍ය රුපියල් ගිණුම්වල පවත්වාගෙන යන්නාවූ ශේෂයන් ජංගම රුපියල් ගිණුම්වලට පරිවර්තනය කිරීම සඳහා 1994 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි අවසර ලබා දෙන ලදී. ඒ අනුව ප්‍රේෂණයන් ජංගම ගිණුම් (ප්‍රාග්ධන නොවන) ගණුදෙනු සඳහා නිදහස් වේ.

නැව් වලට ආහාරපාන සැපයීමේ ව්‍යාපාරය සහ නාවික කාර්ය මණ්ඩලයට දෙනු ලබන ප්‍රසාද දීමනා සඳහා වාණිජ බැංකු වෙතින් විදේශීය මුදල් ලබා ගැනීමට 1994 ජූනි 16 දින සිට අනුමැතිය ලැබිණි.

ආනයන

1994 නොවැම්බර් 18 දා සිට බලපැවැත්වෙන පරිදි ආනයනකරුවන්ට වාණිජමය පදනමක් මත, ණයවර ලිපි විවෘත කිරීමේ අවශ්‍යතාවයෙන් තොරව දින 90 ක් තුළ ඇ.එ.ජ. ඩොලර් 7,500 ක වටිනාකමක් දක්වා ප්‍රතිග්‍රහණය මත භාණ්ඩ ආනයනය කිරීමට අවසර ලැබේ.

රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන් රාජ්‍ය ණය කළමණාකරණය මහ බැංකුව විසින් කරගෙන යනු ලැබීය. ඉකුත් වර්ෂවලදී මෙන් මෙම වසරේදී ද මෙම කාර්යය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් යොදා ගන්නා ලද ප්‍රධාන ණය උපකරණ වූයේ රජයේ සුරැකුම්පත් (රුපියල් ණය), භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර තැන්පතු සහතිකයි. මීට අමතරව, මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. රජයේ විදේශ ණය කළමනාකරණය හා සේවාකරණය ද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යයන් අතර විය. විදේශීය හා දේශීය ණය පිළිබඳ දත්ත පදනම පුළුල් කිරීමත්, එහි ගුණාත්මක බව ඉහළ නැංවීමත් අපේක්ෂාවෙන් මෙම දත්ත පදනම වර්ෂය තුළදී තවදුරටත් වැඩි දියුණු කරන ලදී. රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යයට ආධාරකයක් වශයෙන්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් විවිධ අධ්‍යයනයන් කරන ලදී. රජයේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපල දියුණු කිරීමේ අදහසින්, 1994 දී මෙම උපකරණ වලට සම්බන්ධ නීති සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී.

1994 වර්ෂය අවසාන වන විට නොපියවා තිබූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 5,62,716.3 ක් විය. ලංකා බැංකුව විසින් සේවාකරණය කරනු ලැබූ රජය විසින් සහතික කරන ලද පොදු සේවා ණය ද මීට ඇතුළත්ය. 1993 අවසාන වන විට නොපියවා තිබූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය සමග සසඳන විට 1994 නොපියවූ දළ රාජ්‍ය ණය රුපියල් දශ ලක්ෂ 64,109.3 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. 1994 අවසාන වන විට නොපියවා තිබූ විදේශ ණය වගකීම වූ රුපියල් දශ ලක්ෂ 3,03,245 හි රුපියල් දශලක්ෂ 28,676.6 ක වැඩිවීමක් පෙන්වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 18,125.4 ක් විදේශ විනිමය අනුපාතයේ පිරිහීම හේතුකොට ගෙන ඇති වූවකි. නොපියවූ මුළු රාජ්‍ය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් විදේශීය ණය ප්‍රමාණය සියයට 53.9 ක් වූ අතර, ඉතිරි සියයට 46.1 ක ප්‍රමාණය දේශීය ණය වලින් සමන්විත විය.

1994 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 46,877.8 ක් වටිනා රුපියල් ණය ලබා ගන්නා ලදී. වර්ෂය තුළදී රුපියල් ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 14,955.5 ක් සහ රුපියල් දශලක්ෂ 16,678.8 ක් විය. 1994 වර්ෂය අවසාන වන විට නොපියවා තිබූ මුළු රුපියල් ණය ප්‍රමාණය (දළ) රුපියල් දශලක්ෂ 1,37,553.8 ක් වූ අතර, මීට ලංකා බැංකුව හා මහජන බැංකුව ප්‍රතිව්‍යුහකරණය සඳහා රජය විසින් 1993 දි නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 24,088 ක් වටිනා දීර්ඝ කාලීන බැඳුම්කර ද ඇතුළත් විය. සේවක අර්ථසාධක අරමුදල 1994 වර්ෂයේදී ද රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයා වූ අතර, වර්ෂය අවසාන වන විට එහි දයකත්වය නොපියවූ රුපියල් ණය ප්‍රමාණයෙන් සියයට 56.4 ක් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව රුපියල් ණය සඳහා දෙවන විශාලතම දයකයා වෙමින් මුළු නොපියවූ රුපියල් ණය ප්‍රමාණයෙන් සියයට 22.4 ක ප්‍රමාණයක් දරන ලදී.

1992 දෙසැම්බර් 16 දින රුපියල් දශලක්ෂ 90,000 සිට රුපියල් දශලක්ෂ 1,25,000 දක්වා වැඩි කරන ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ අනුදත් සීමාව 1994 වර්ෂය තුලදී නොවෙනස්ව

පැවතුණි. 1992 ජූලි මස 24 වැනි දින හඳුන්වා දෙනු ලැබූ බලයලත් ප්‍රාථමික වෙළෙඳුන් ක්‍රමය, භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික හා ද්විතීය වෙළෙඳපොල සක්‍රිය කිරීමේ හා දියුණු කිරීමේ පරමාර්ථයෙන්, 1994 දී. තවදුරටත් විධිමත් කරන ලදි. ඒ අනුව, බලයලත් ප්‍රාථමික වෙළෙඳුන් 18 දෙනෙකුගෙන් 17 දෙනෙකු ප්‍රාථමික වෙළෙඳුන් වශයෙන් පත් කරන ලදී. මීට අමතරව, මෙම වර්ෂය තුළදී නව ප්‍රාථමික වෙළෙඳුන් 05 දෙනෙකු එනම්, ඩොයිෂ් බැංකුව, මෂ්රෙක් බැංකුව පී. එස්. සී. හබීබ් බෑන්ක් ඒ. ජී. සූරිච්, සී/ස. සෙලින්කෝ සෙකියුරිටීස් හා ෆයිනෑන්ෂල් සර්විසස් සහ සී/ස. වනික් ඉන්කෝපරේෂන් පත් කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාථමික වෙළෙන්දන් සංඛ්‍යාව 18 සිට 22 දක්වා වැඩි විය. මෙම නියෝජිතයින් සංඛ්‍යාවට වාණිජ බැංකු 16 ක් සහ වාණිජ බැංකු නොවන ආයතන 06 ක් ඇතුළත් විය. එමෙන්ම, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් සඳහා වූ වගකීම් හා වරප්‍රසාද දැක්වෙන ප්‍රකාශයක් 1994 නොවැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදි. මෙම ප්‍රකාශනය සමඟ වාර්තා කිරීම සඳහා වූ සම්මත ආකෘති පත්‍රයක් ද ප්‍රාථමික වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලැබීය. මෙම ආකෘති පත්‍ර මත සපයනු ලබන තොරතුරු උපයෝගී කරගෙන දත්ත පදනමක් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'ග්‍රාහක ආයෝජකයින්' ලෙස බලය පවරන ලද ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද අනෙකුත් අරමුදල් වලින් තරඟකාරී නොවන ලංසු පිළිගෙන, එකී ලංසු සඳහා බරතැබූ සාමාන්‍ය පොලී අනුපාතිකයක් ප්‍රදානය කිරීම ද විමර්ශනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළදී නොකඩවා කරගෙන යනු ලැබීය. භාණ්ඩාගාර බිල්පත් පොළිය මත අය කරන ලද රඳවාගැනීමේ බද්ද 1994 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරනු ලැබීය.

පරිණත කාලය මාස 03, 06 හා 12 සඳහා වූ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම දෙපාර්තමේන්තුව විසින් කර ගෙන යන ලදි. ඊට අමතරව මාස 03 ට වඩා අඩු දින ගණනක් සඳහා වූ පරිණත කාලයක් සහිත බිල්පත් ද ද්විතීය වෙළඳපොලේ අලෙවිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරන ලදී. ඒ සමගම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුදල් වෙළෙඳපොලෙහි, විශේෂයෙන් රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොලෙහි උන්නතිය සඳහා වෙළෙඳපොල ක්‍රියාකාරීන් සමඟ අඛණ්ඩ සංවාද පවත්වාගෙන යමින් ප්‍රාථමික නියෝජිතයන් සමඟ සතිපතා රැස්වීම් මෙහෙයවනු ලැබීය. මූල්‍ය පාලන උපාය මාර්ගවල කොටසක් වශයෙන් මූල්‍ය මෙහෙයුම් ඒකකය, වෙන්දේසි සඳහා ඉදිරිපත් කළ යුතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සහ මහ බැංකුවට වෙන් කරන ලද බිල්පත්වල පරිණත කාල ව්‍යාප්තිය තීරණය කිරීම් ආදිය සතිපතා පදනමක් මත කරගෙන යනු ලැබීය.

භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික නිකුතුවෙන් මහ බැංකුව විසින් දරනු ලබන ප්‍රමාණය 1993 වර්ෂය අවසානයේ රුපියල් දශලක්ෂ 5, 978.0 ක හෝ නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙන් සියයට 6.2 ක මට්ටමේ සිට 1994 දෙසැම්බර් අවසාන වන විට රුපියල් දශලක්ෂ 8,979.1 හෝ නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වටිනාකමින් සියයට 9.1 දක්වා ඉහළ නැගුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහ බැංකු නොවන අංශය විසින් දරන ලද බිල්පත් ප්‍රමාණය 1993 වර්ෂය අවසානයේ වූ රුපියල් දශලක්ෂ. 91,217.7 හෝ නොපියවූ මුළු බිල්පත් ප්‍රමාණයෙන් සියයට 93.8 සිට 1994 අවසන් වන විට රුපියල් දශලක්ෂ. 89,916.6 හෝ සියයට 90.9 දක්වා පහත වැටුනි. මේ අතර, පෙර වර්ෂයේ නොපියවූ මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වන රුපියල් දශලක්ෂ 97,195.7 හා සසඳන විට රුපියල් දශලක්ෂ 1,700.0 ක වැඩිවීමක් පෙන්වමින් 1994 දී නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 98,895.7ක් විය. මෙම වර්ධනය වර්ෂය තුළදී කරන ලද රුපියල් දශලක්ෂ 5,500.0 ක් වූ නව නිකුතුවල සහ රුපියල් දශලක්ෂ 3,800 ක්වූ භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීම්වල ප්‍රතිඵලයකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය තුළ ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17,915.2 ක් විය.

විමර්ශනයට භාජනයවූ වර්ෂය තුළදී පරිණත කාලය මාස 3,6 හා 12 ක්වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලද-අනුපාතික පිළිවෙලින් වසරකට සියයට 11.58 - 18.73, 11.71 - 19.29 සහ 12.20 - 19.43 අතර උච්ඡාවචනය විය. 1994 ඔක්තෝම්බර් මාසය දක්වා පොළී අනුපාතිකයේ අඩුවීමේ නැඹුරුවක් පෙන්නුම් කළ අතර නොවැම්බර් හා දෙසැම්බර් දෙමස තුළ එය ප්‍රතිවිරුද්ධ අතට ගමන් කරන ලදී.

1990 දී ආරම්භ කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතික නිකුත් කිරීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යනු ලැබීය. මෙම සහතික මාස 06, 12 සහ 24 යන පරිණත කාලයක්

සඳහා නිකුත් කරන ලද අතර ඒ සඳහා අදාල වාර්ෂික පොලී අනුපාතිකයන් 1994 වර්ෂය තුළදී ද පිළිවෙලින් සියයට 17.15, සියයට 18.06 සහ සියයට 19.83 යන මට්ටම් වල නොවෙනස්ව පැවතුණි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අලෙවි කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතිකවල මුහුණත අගය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 71.9 ක් හා රුපියල් දශලක්ෂ 65.9 ක් විය. මේ මූලාශ්‍රයන් දෙකට අදල ආපසු ගෙවීම්වල වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 63.5 ක් හා රුපියල් දශලක්ෂ 43 ක් වූ අතර මීට රුපියල් දශලක්ෂ 17 ක්වූ පොළී ගෙවීම් ද ඇතුළත් විය. 1994 අවසාන වන විට නොපියවූ භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශලක්ෂ 144.9 ක් විය.

වෙළෙඳපොලේ පවතින අධි ද්‍රවශීලතාවය ඇදගැනීමේ පරමාර්ථයෙන් 1993 ඔක්තෝම්බර් මස 19 වැනි දින ඇරැඹි මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. ඒ අනුව මාස 03 ක හා මාස 06 ක පරිණත කාලයන් සඳහා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 2,990 ක් හා රුපියල් දශලක්ෂ 3,435 ක් වටිනා මහ බැංකු සුරැකුම්පත් 1994 වසර තුළදී නිකුත් කරන ලදි. 1993 දෙසැම්බර් අවසානයේදී සියයට 18 ක් ව පැවති මහ බැංකු සුරැකුම්පත්වල වාර්ෂික පොළී අනුපාතිකය 1994 ජනවාරි මාසයේදී සියයට 16 දක්වා ද, පෙබරවාරි අවසානයේදී සියයට 15 දක්වාද පහත වැටුන අතර 1994 මාර්තු මාසයේදී සියයට 13 දක්වා තවදුරටත් පහත හෙලනු ලදුව එම අනුපාතිකය 1994 සෙසු කාල පරිච්ඡේදය තුළදී නොවෙනස්ව පැවතුණි. මෙම නිකුතුවලට අදල බර තබන ලද වාර්ෂික සාමාන්‍ය පොළී අනුපාතිකයන් පරිණත කාලය මාස 03 සහ මාස 06 සඳහා පිළිවෙලින් සියයට 12.06 සිට සියයට 14.70 දක්වාත්, සියයට 13.67 සිට සියයට 18.37 දක්වාත් විය.

1994 වර්ෂය තුළදී මධ්‍යකාලීන හා දීර්ඝකාලීන විදේශීය රාජ්‍ය ණය මුළු ප්‍රතිලබ්ධි ප්‍රමාණය රුපියල් දශලක්ෂ 18,620 ක් විය. උපයෝගි කරගත්තා ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 70.2 ක් ව්‍යාපෘති ණය වූ අතර ඉතිරිය ව්‍යාපෘති නොවන අනෙකුත් ණය වලින් සමන්විත විය. 1994 දී විදේශීය රාජ්‍ය ණය සඳහා මුළු පොළී සහ අනෙකුත් ගාස්තු ගෙවීම් ප්‍රමාණය (පරිපාලන ණය සඳහා ගෙවන ලද පොළිය හැර) රුපියල් දශලක්ෂ 5,584.3 ක් විය.

ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුර හා මාතලේ

1994 වර්ෂය තුළදී, මාතර, අනුරාධපුර සහ මාතලේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල තුන මගින් ඉටු කරනු ලබන ව්‍යවහාර මුදල් කටයුතු, චෙක්පත් නිෂ්කාශන කටයුතු, දත්ත එක්රැස් කිරීමේ කටයුතු ආදී සම්ප්‍රදායික මහ බැංකු කටයුතු වලට අමතරව ග්‍රාමීය ප්‍රදේශවල මෙම කාර්යාල මගින් ඉටු කරනු ලබන සංවර්ධන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මෙම සංවර්ධන කාර්යයන්ට, කෘෂිකාර්මික හා අනෙකුත් අදල ක්ෂේත්‍රයන් පිළිබඳව ප්‍රතිලාභ පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කටයුතු (ප්‍රා. ග්‍රා. සං. බැංකු) පරීක්ෂා කිරීම සහ සංවර්ධන කටයුතුවලට අදලව රජයේ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම ඇතුළත් විය.

මාතර ප්‍රාදේශීය කාර්යාලය, කුඩා තේවතු සංවර්ධන ව්‍යාපෘතිය, දිපව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය, දේශීය බිල්පත් ණය යෝජනා ක්‍රමය, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සහ දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය වැනි ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල නිරත විය. මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මේ වසර තුලදී මාතර හා හම්බන්තොට ප්‍රා. ග්‍රා. සං. බැංකුවට අයත් ශාඛා තුනක කටයුතු පරීක්ෂා කරන ලදි.

1994 වසර තුළදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය රාජ්‍ය ආයතන සමග එක්ව, ඉදිරියේදී ණයලාභීන් විය හැකි පුද්ගලයින් 1400 කට වැඩි සංඛ්‍යාවක් සඳහා ප්‍රතිලාභීන් පුහුණු වැඩසටහන් 43 ක් පවත්වන ලදි. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් ගොවිතැන් කටයුතු, කිරිපට්ටි සංවර්ධනය හා සහල් සැකසීම යනාදී ක්ෂේත්‍රයන්ට අදල විය. තවද, ප්‍රාදේශීය කාර්යාලය මගින් කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව හා අනුරාධපුර ප්‍රා. ග්‍රා. සං. බැංකුවලට අයත් බැංකු ශාඛා නවයක කටයුතු පරීක්ෂා කරන ලදී.

1994 වසරේදී මාතලේ ප්‍රදේශීය කාර්යාලය මගින් කුඩා පරිමාණ නිෂ්පාදන, අලෙවිකරන හා කිරිපට්ටි සංවර්ධනය වැනි ක්ෂේත්‍රවලට අදළව, ඉදිරි කාලයේ දී ණයලාභීන් විය හැකි පුද්ගලයින් 1,362 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 20 ක් පවත්වන ලදි. දුරස්ථ පළාත්වල

ඉදිරි කාලයේ ණය ලාභීන් විය හැකි අය අතර ණය ක්‍රමයන් පිළිබඳ අවබෝධයක් ඇති කිරීමේ අරමුණින් " ජනහමුව" රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති ණය ක්‍රමය හා නිත්‍ය භෝග සංවර්ධන ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් වූ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය විසින් තවදුරටත් සිදු කරන ලදී. මාතලේ සහ නුවර-එළිය දිස්ත්‍රික්කයේ ප්‍රා.ග්‍රා.සං. බැංකු වලට අයත් බැංකු ශාඛාවල කටයුතු පරීක්ෂා කිරීමද මෙම ප්‍රාදේශීය කාර්යාලය මගින් සිදු කරන ලදී.

1994 වසර තුළදී, මාතර හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල දෙක මගින් මුදල් හුවමාරු පහසුකම් තවදුරටත් ලබාදෙන ලදී. එම වසර තුළදී ප්‍රාදේශීය කාර්යාල මගින් වාණිජ බැංකු සඳහා ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන පහසුකම් අඛණ්ඩව ලබා දෙන ලදී. මාතර ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශනාගාරය රුපියල් දශලක්ෂ 1,989 ක් වටිනා චෙක්පත් 156,950 ක්ද, අනුරාධපුර නිෂ්කාශනාගාරය රුපියල් දශලක්ෂ 1,447ක් වටිනා චෙක්පත් 1,23,913ක්ද නිෂ්කාශනය කරනලදී. රුපියල් දශලක්ෂ 16,505 ක් වටිනා චෙක්පත් 6,02,604 ක් මහනුවර හා මාතලේ පිහිටි මාතලේ ප්‍රාදේශීය කාර්යාලයෙහි නිෂ්කාශනාගාරයන් මගින් නිෂ්කාශනය කරන ලදී.

ලේකම් දෙපාර්තමේන්තුව

සේවා දෙපාර්තමේන්තුවක් වන ලේකම් දෙපාර්තමේන්තුව 1994 වර්ෂය තුළ ඉටු කළ කාර්යයන් වූයේ මූල්‍ය කටයුතු, නෛතික සේවා සැපයීම, භාණ්ඩ, උපකරණ හා අනෙකුත් අවශ්‍ය දෑ සැපයීම, විදේශ හා දේශීය ගමන් පිළිබඳ කටයුතු යනාදී පරිපාලනමය කටයුතුය.

බැංකු පනත, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, මුදල් නීති පනත, ලියාපදිංචි ව්‍යාපාර වස්තු හා ඇපකර ආඥා පනත, ණයතොරතුරු කාර්යාංශ පනත ආදී පනත් සඳහා සංශෝධන සකස්කිරීමෙහිලා නීති අංශය ක්‍රියාකාරී ලෙස නිරතවිය.

ප්‍රවෘත්ති සහ ප්‍රකාශන

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයව පැවතියේ රට තුළ සහ ලෝක ව්‍යාප්ත පදනමක් මත තොරතුරු ඒකරාශී කර ගැනීම හා එසේ ඒකරාශී කරගත් තොරතුරු බෙදහැරීමය. ප්‍රකාශයට පත්කළා වූද, ප්‍රකාශයට පත් නොකළා වූ ද විෂය කරුණු අඩංගු දෙපාර්තමේන්තුවට අයත් වාර ප්‍රකාශන සහ සඟරා ආදී සම්පත් පහසුවෙන් උපයෝගී කරගැනීමට අවස්ථාව සැලසීම මගින් ආර්ථික සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන ශිෂ්‍යයින්, ගුරුවරුන් බැංකුකරුවන් පර්යේෂකයින් හා අනෙකුත් අය බෙහෙවින් ප්‍රයෝජන ලබා ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ප්‍රකාශන නිකුත් කැරිණි.

1. වාර්ෂික වාර්තාව - 1993 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
2. ආර්ථික සමීක්ෂණය - 1994 ප්‍රථම භාගය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
3. ද්විමාසිකආර්ථික විවරණිකාව - ඉංග්‍රීසි
4. මාසික විවරණිකා (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
5. සමාජ ආර්ථික දත්ත බැඳුම 1994 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
6. සටහන සංයුක්ත වෙළුම 7 සහ 8 (සිංහල)
7. කාලීන පත්‍රිකා - 23 සහ 24
8. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ සමාජ ප්‍රගතිය (සිංහල)

දෙපාර්තමේන්තුව, ස්වකීයමය වූ ප්‍රකාශන, එනම්, සටහන, නිව්ස් සර්වේ හා බැංකු පුවත් නොකඩවා පළ කරන ලදී.

මහජනතාව වෙත තොරතුරු බෙදහැරීමේ ප්‍රධානතම මාර්ගය වූයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යය, පුවත් නිවේදන සහ සම්මන්ත්‍රණයන්ය.

තොරතුරු ඒකරාශී කැරෙන ප්‍රධානතම තැන්පතු ඒකකය වන පුස්තකාලය, නව පොතපත් වාරික සඟරා, පත්‍රිකා ආදිය එකතු කිරීම මගින් එහි තොරතුරු මූලපාදනය තවදුරට ද ශක්තිමත් කරන ලදී. පුස්තකාලය තත් වර්ෂය තුළදී පොත් 287 හා පත්‍රිකා 121 ක් අළුතින් එක්කළ අතර, විවිධ වාරික සඟරා 236 කට දායක විය. තවද වෙනත් බැංකු, සෙසු පුස්තකාල හා ආයතනවලින් තිළිණ හා හුවමාරු වශයෙන් පොත් හා පත්‍රිකා 244 ක් ලබා ගන්නා ලදී. පුස්තකාලය සතු විරල ගණයේ පොත් ප්‍රදර්ශනය 1994 දී දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

දෙපාර්තමේන්තුවේ වීඩියෝ ඒකකය, සේවක අර්ථසාධක අරමුදල, හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අදළ කටයුතු අළලා වාර්තාමය වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කරන ලදි. තවද මෙම ඒකකය මගින් මහ බැංකුවේ පැවැත්වූ සම්මන්ත්‍රණ 16 ක් සහ වෙනත් වැදගත් කටයුතු පටිගත කරන ලදි. චිත්‍ර හා රූපසටහන් පිළිබඳ දෘෂ්‍ය ඒකකය, පොත් කංචුක නිර්මාණය, පත්‍රිකා හා පෝස්ටර් ආදිය නිර්මාණයෙහි දිගින් දිගටම නිරත වූ අතර, ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 50 වැනි සංවත්සරය නිමිත්තෙන් නිකුත් කිරීමට නියමිත රු.2/= ක වටිනාකමින් යුත් කාසියක් ද නිර්මාණය කරන ලදි.

දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපනික ව්‍යාපෘතිය සිසු සිසුවියන් හා ගුරුවර ගුරුවරියන් රාශියක් සිය වැඩසටහන්වලට සහභාගි කරවා ගැනීමට තවදුරටත් සමත් විය. ප්‍රධාන කාර්යාලයේදී වැඩසටහන් 31 ක් පවත්වන ලද අතර, සිසුන් 1,902 ක්ද , ගුරුවරුන් 141 දෙනෙක් ද මේවාට සහභාගි වූහ. පිටපළාත්වල පැවැත්වූ වැඩසටහන් සඳහා සිසුන් 3,120 සහභාගිවූ අතර, ගම්පහ, මීගමුව, බියගම, මිනුවන්ගොඩ, පිළියන්දල හා හෝමාගම අධ්‍යාපන කොට්ඨාශවල පාසැල් 60 ක සිසුන් ඒවාට සහභාගී වූහ.

මහ බැංකුවේ මුද්‍රණ කටයුතු වලින් සියයට 90 ක් මහ බැංකු මුද්‍රණාලය මගින් ඉටු කැරිණි. අදළ වර්ෂයේදි මුද්‍රණ කටයුතු පැවැරුම් 348 ක් මෙම මුද්‍රණාලය මගින් සතුටුදයී අන්දමින් නිමකරන ලදි.

පර්යේෂණ කටයුතු

වර්ෂය තුළදී මහ බැංකුවේ නිලධාරිහු තමන්ගේ මූලිකත්වයෙන් ආරම්භකරන ලද හෝ වෙනත් ආයතනවල ඉල්ලීම් සපුරාලීම පිණිස පර්යේෂණ අධ්‍යයනයන් ගණනාවක් කිරීමට බාරගන්නා ලදී. ප්‍රතිපත්ති මූලික අධ්‍යයනයන් මෙන් ශාස්ත්‍රීය වැදගත් කමින් යුතු පර්යේෂණද මේවාට ඇතුලත්ය.

සමීක්ෂණ හා දත්ත එක්රැස් කිරීම

දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කෙරෙන ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය 1992 - 1993

1992 / 1993 වර්ෂයේදී දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කෙරුණ ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණයේ ක්ෂේත්‍ර වැඩකටයුතු සහ එක් රැස් කරන ලද දත්තයන් සංඛ්‍යා සටහන් ලෙස සකස් කිරීම වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. විධිමත් අංශයෙන් ණය ලබාගැනීම සම්බන්ධයෙන් ජාතික ණය සැළසුමක් සකස් කිරීම සඳහා ආර්ථික වශයෙන් පසුබෑමකට ලක්ව ඇති අංශවල ණය අවශ්‍යතා පිළිබඳව සොයා බැලීම මෙම සමීක්ෂණයේ මූලික අරමුණ විය. එයට අමතරව ආයතනික අංශයෙන් දෙනු ලබන ණය විවිධ ආදයම් කාණ්ඩවලට ලැබී තිබේද? එසේ නම් එම ණය ආදයම් ඉපැයීමේ මාර්ගවල යොද ඇති ආකාරය පිළිබඳව සොයා බැලීම ද මෙම සමීක්ෂණයේ අනෙකුත් අරමුණු විය.

මෙම අරමුණු වලින් යුතුව, කුටුම්භයන් 33,000 ක නියැදියක් සමීක්ෂණයට භාජනය කරමින් ඔවුන් ණය ලබාගත් මූලාශ්‍ර, ණය උපයෝජනය ණය අවශ්‍යතාවයන්, ව්‍යවසායකත්වය, ආදයම් ඉපැයීමේ මාර්ග හා ණය ආපසු ගෙවීම පිළිබඳව ගැඹුරු විග්‍රහයක් කිරීමේ අදහසින් මෙම සමීක්ෂණයට භාජනය වූ කුටුම්භ වල ජන විකාශන ලක්ෂණ, නිවාස තත්ත්වය, ඉඩම් උපයෝජනය, ශ්‍රම හමුදව, සේවා වියුක්තිය හා මිනිස් බල උපයෝජනය, කුටුම්භ ආදයම, ඉතිරි කිරීම් සහ ආයෝජනය ආදී සමාජ ආර්ථික තොරතුරු ද ලබා ගැනිණි

ප්‍රතිපත්ති සකස් කිරීමේ අරමුණ සඳහා ණය සම්බන්ධීකරණ හා සුපරීක්ෂණ කමිටුවේ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය වන, තාවකාලික දත්තයන් පදනම් කරගත් වාර්තා සකස් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරිණි. සමීක්ෂණයෙන් ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණය සහ අවසන් වාර්තාව සකස් කිරීම දැන් කරගෙන යනු ලැබේ.

දිප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල

1978 වසරේදී දියත් කළ දිප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල පුරා අවුරුදු 16 ක් සපුරාලමින් 1994 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වුණි. තෝරා ගත් මධ්‍යස්ථානයන් මගින් පාරිභෝගික ද්‍රව්‍යයන්ගේ සිල්ලර මිල භාණ්ඩ විශාල සංඛ්‍යාවක නිෂ්පාදන මිළ, ප්‍රධාන කෘෂිකාර්මික යෙදවුම්

වල පිරිවැය සහ සංවිධානාත්මක නොවන අංශයේ වී, තේ, රබර් සහ පොල් වගාවන්ට අදාළ කාර්යයන්හි හා කුඩා පරිමාණයේ ඉදිකිරීම් කර්මාන්ත අංශයේ දෛනික වැටුප් පිළිබඳ දත්තයන් ක්‍රමානුකූල පදනමක් යටතේ එක්රැස් කරනු ලැබේ. මෙම වැඩපිළිවෙල යටතේ තොරතුරු එක් රැස් කිරීම උතුරු පලාත හැර රජයේ පාසැල් වලින් තෝරාගත් ගුරුභවතුන් මගින් සිදු කෙරේ. මෙම වැඩපිළිවෙල යටතේ එක්රැස් කරනු ලබන දත්තයන් මිළ සහ වැටුප් සංඛ්‍යාන නම් වූ ප්‍රකාශනය මගින් ඉදිරිපත් කෙරේ.

කල්තියා අනතුරු ඇඟවීමේ මූලික අරමුණු සපුරාලීම් සඳහා 1994 වර්ෂයේදී මෙම වැඩපිළිවෙලෙහි කටයුතු පුළුල් කරමින්, නුදුරු අනාගතයේදි නිෂ්පාදන නැඹුරුව සහ නිෂ්පාදන මිළ ගණන් උච්චාවචනය වීමේ හේතු පිළිබඳව ද තොරතුරු රැස්කිරීම සිදු කරන ලදී.

ජාතික ගිණුම්

ජාතික ආදයම් ගිණුම් ඇස්තමේන්තු කිරීම සම්බන්ධ කටයුතු තවදුරටත් නොකඩවා ක්‍රියාත්මක විය. ප්‍රාථමික හා ද්විතියික දත්ත රැස්කිරීම හා වාර්තා පිළියෙල කිරීම මෙම කටයුතු වලට ඇතුළත් වේ. හැකි සෑම අවස්ථාවකම කාර්තු අනුව මෙම දත්ත රැස් කිරීම කරනු ලැබේ. ජාතික ආදයම පිළිබඳ කාර්තුගත ඇස්තමේන්තු 1993 හා 1994 වර්ෂය සඳහා සකස් කරනු ලැබ ඇත. වඩාත් ආසන්න පාද වර්ෂයක් පදනම් කර ජාතික ආදයම් ඇස්තමේන්තු ගණනය කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිශෝධනය කිරීම සඳහා මූලික කටයුතු දැනටමත් ආරම්භ කර තිබේ. එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාන කාර්යාලය මගින් 1993 දී ප්‍රසිද්ධියට පත් කරන ලද "ජාතික ගිණුම් පිළිබඳ ප්‍රතිශෝධන ක්‍රම" හි දක්වා ඇති ප්‍රතිශෝධන උපදෙස් අනුව ක්‍රියා කිරීමේ ප්‍රමාණවත් ප්‍රගතියක් දක්නට ලැබේ.

ආනයන සුපරීක්ෂණය

ආනයන පිළිබඳව පුරෝකථනයක් ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වෙතින් ලැබෙන ණයවර ලිපි පිළිබඳ තොරතුරු පදනම් කොටගෙන රටෙහි ආනයන පිළිබඳ සුපරීක්ෂණය කිරීම දිගටම සිදු කරනු ලැබිය.

සේවා නියුක්ති සංඛ්‍යා

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වූ වාර්ෂික සමීක්ෂණය දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කරනු ලැබිය. මෙම සමීක්ෂණයේ අරමුණ වනුයේ රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ සංස්ථා අංශයෙහි සේවා නියුක්තියේ උපනතීන් පිළිබඳ තොරතුරු ලබාගැනීමයි. මීට අමතරව සංවිධිත පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තියේ උපනතීන් අධ්‍යයනය කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල සහ වෙනත් අර්ථසාධක අරමුදල් වලට අදාළ පරිපාලන වාර්තා වලින් ද දත්ත ලබාගැනිණි.

දත්ත සැකසුම්

මූල්‍ය ක්‍රමයෙන් මතුවන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මහ බැංකුව තම කියාකාරීත්වය නවීකරණය කරයි. බැංකුවේ කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය හා නිෂ්පාදන ශක්තිය වැඩි දියුණු කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණයේ සිදුවන සංවර්ධනයන් උපයෝගී කරගනිමින් නව තොරතුරු තාක්ෂණ රාමුවක් හා ප්‍රමිතින් දැනට හඳුනාගෙන ඇත. නව ක්‍රමයෙන් බලාපොරොත්තු වන මූලික ලක්ෂණය නම් දැනට තිබෙන මධ්‍යගත ක්‍රමයේ සිට වඩාත් විමධ්‍යගත ක්‍රමයක් කරා යාමය.

නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ මුල් පියවර 1994 වසරේදී ගනු ලැබුණි. ආරම්භයේදීම මුල් තැන දිය යුතු අවශ්‍යතාවයන් ලෙස හඳුනාගනු ලැබුයේ නව පරිසරයට හුරුවීමට බැංකු කාර්ය මණ්ඩලය පුහුණු කිරීමය. ඒ අනුව රාජගිරියේ පිහිටි ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයෙහි කුඩා පරිඝනක පදනම් කරගත් පරිඝනක ජාලයක් පිහිටුවන ලදි. ඊට අමතරව මහ බැංකුවේ භාවිතය සඳහා කුඩා පරිගණකයන්ත්‍ර 100ක් මිළදී ගැනීමට පියවර ගන්නා ලදී. අභ්‍යන්තර ජාලයක් ලෙස කුඩා පරිඝනක සම්බන්ධීකරණය දැනට සැලසුම් කරගෙන යනු ලැබේ. දැනට සිදුවන පරිඝනක භාවිතය වැඩි දියුණු කිරීමට දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව ක්‍රියා කරන ලදි. පුස්තකාලය සඳහා කුඩා පරිමාණ දත්ත පද්ධතියක් හා තොරතුරු සංරක්ෂණ ක්‍රමයක සමහර අංශ පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මූලික අධ්‍යයනයක් කරන ලදී.

ශ්‍රී ලාංකා නිෂ්කාශනාගාරයෙහි ක්‍රියාකාරිත්වය (SLACH)

(1) ශ්‍රී ලංකා චෙක්පත් නිෂ්කාශනාගාරයේ කටයුතු පුළුල් කිරීම

චෙක්පත් නිෂ්කාශනාගාරයේ දැනට පවත්නා උපකරණ සැලසුම් කොට ඇත්තේ දිනකට සාමාන්‍ය චෙක්පත් සංඛ්‍යාව 50,000 ක තරම් ප්‍රමාණයකට වන අතර, චෙක්පත් 75,000ක් වැනි අධික ප්‍රමාණයක නිෂ්කාශනය වුවද එම යන්ත්‍රවලින් කළ්හැක. එහෙත් අදවන විට නිෂ්කාශනාගාරයට ලැබෙන චෙක්පත් සංඛ්‍යාව සාමාන්‍යයෙන් දිනකට චෙක්පත් 1,00,000 ඉක්මවා යන අතර, සමහර දිනවල එය චෙක්පත් 2,00,000 දක්වා ඉහළ යයි. චෙක්පත් 1,25,000ක් තරම් වන අධික ප්‍රමාණයක් බොහෝ දිනවල නිෂ්කාශනය සඳහා ඉදිරිපත් වීම වර්තමානයේදී නිතර සිදුවන්නක් වී තිබේ. මෙවැනි ඉල්ලුමක් සපුරාලීම සඳහා වසර 7ක් පැරණි උපකරණ භාවිතය ඉතාමත් අවදානම් සහගතය. එමෙන්ම චෙක්පත් නිෂ්කාශනාගාරයෙහි වැඩ ඇනහිටීමකින් බැංකුවලට සහ ගණුදෙණුකරුවන්ට මහත් අපහසුතාවයක් සහ විශාල මූල්‍ය අලාභයක් සිදුවිය හැකිය.

මේ හේතුවෙන් විමර්ශනයට ලක් කරනු ලබන කාලය තුල චෙක්පත් නිෂ්කාශණාගාරයේ කටයුතු පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබීය. යෝජිත පුළුල් කිරීම් කටයුතු අතර, කොළඹ ප්‍රධාන නිෂ්කාශනාගාරයේ පැරණි යන්ත්‍ර වෙනුවට නවීනතම ස්වයංක්‍රිය ක්‍රියාකාරිත්වයකින් යුත් පරිඝනක යන්ත්‍ර සවිකිරීමට කටයුතු යොදා ඇත. එම නවීන යන්ත්‍ර මගින් දිනකට චෙක්පත් 1,50,000 ක ප්‍රමාණයක් සඳහා නිෂ්කාශන පහසුකම් සැලසිය හැකිවනු ඇත. එමෙන්ම එම ප්‍රමාණයෙන් 100% ක ඉහළ ධාරිතාවයක් ඇති දිනයකදී වුවද එයට මුහුණ දීමට මෙම යන්ත්‍ර වලට හැකියාවක් ඇත. මෙම නවීන යන්ත්‍ර සවිකිරීමත් සමගම කොළඹ ප්‍රධාන නිෂ්කාශනාගාරයේ දැනට ඇති පරිඝනක යන්ත්‍ර ඉන් ඉවත්කර ඒවා මහනුවර පිහිටුවීමට යෝජිත ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශනාගාරයේ සවිකරනු ඇත. මෙමගින් හදිසි අවස්ථාවකට මුහුනදීමේ පහසුකම් සැලසෙනු ඇත.

(II) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (S L I P S)

ශ්‍රී ලංකා ස්වයංකෘත නිෂ්කාශනාගාරයට සම්බන්ධ නොකර සිදු කරනු ලබන අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයේ කටයුතු පුළුල් කිරීම මෙම වර්ෂයේදී දක්නට ලැබුණි.

1993 වර්ෂයේදී මෙම ක්‍රමය ආරම්භ කරන විට එයට සහභාගී වූයේ වාණිජ බැංකු 6 ක් පමණි. සිදුකල දෛනික ගනුදෙනු ප්‍රමාණය 20 ක් පමණ විය. එහෙත් වර්තමානයේ ලංකාවේ සියළුම වාණිජ බැංකු මෙම ක්‍රමයට සහභාගී වන අතර, දිනක ගණුදෙනු ප්‍රමාණය 1000 ඉක්මවයි.

1994 වර්ෂය තුළදී අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය පහත දක්වා ඇති ගණුදෙනු කටයුතු සඳහා පුළුල් කරන ලදී.

(අ) වැටුප් ගෙවීම;
(ආ) විදේශ ව්‍යවහාර මුදල් මිළට ගැනීම;
(ඇ) ගණුදෙනුකරුවන්ගේ (රුපියල් දශලක්ෂයකට වැඩි) මුදල් පැවරුම් සම්බන්ධ ගණුදෙනු
(ඈ) විදේශීය අණකර ගණුදෙනු නිරවුල් කර ගැනිම.

සෘජු හර ගෙවීම් සඳහා මෙම ක්‍රමය උපයෝගී කර ගැනීමට දැනට රක්ෂණ සමාගම්, විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වැනි ආයතන සමග සාකච්ඡා පවත්වමින් සිටින අතර, අදාල පරිඝනක වැඩසටහන් දැනටමත් නිෂ්පාදනය කර ඇත. සෘජු හර ගෙවීම් මෙම අන්තර් බැංකු ක්‍රමයේ අවසන් අදියර වන අතර එම ක්‍රමය සම්පූර්ණයෙන් දියුණුවූ විට ඉහත සඳහන් පරිභෝජිකයන් වෙත බිල්පත් ඉදිරිපත් කරන ආයතන වලට තමන් වෙත ලැබිය යුතු මුදල් පහසුවෙන් අයකරගත හැකි වනු ඇත.

පුහුණු කිරීම්

මහ බැංකුවේ නිලධාරීන්ට, ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය රටවලත් අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන ක්ෂෙත්‍රවල පුහුණු වැඩසටහන් සකස් කරදීමේ කාර්යය පෙර වර්ෂවලදී මෙන්ම 1994 වර්ෂය තුළදීද පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් පවත්වාගෙන යන ලදී. අධ්‍යාපනික පුහුණු පාඨමාලා සැකසීම පිළිගත් විශ්ව විද්‍යාලවලදී ආර්ථික විද්‍යාව හා ඊට සමගාමී ක්ෂෙත්‍රයන්හි පශ්චාත් උපාධිවලට අදාළව සිදු කරන ලදී. එමෙන්ම ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි සඳහා නිලධාරීන් ලියාපදිංචි කිරීමද සිදු කැරිණ. මෙම වර්ෂය තුළදී ශාස්ත්‍රපති අධ්‍යාපන පාඨමාලාවන් සඳහා නිලධාරීන් 11 දෙනෙකු එතෙර ගිය අතර ආචාර්ය උපාධි පාඨමාලාවන් සඳහා නිලධාරීන් දෙදෙනෙකුත් එතෙර යන ලදී.

අධ්‍යාපනික නොවන කෙටිකාලීන පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදී පුහුණු කටයුතු බැංකුවේ විශේෂිත ක්ෂෙත්‍රයන්ට අදාළව මෙරට දී මෙන්ම එතෙරදී ද පවත්වාගෙන යනු ලැබිණ. 1994 වර්ෂය තුළදී කෙටි කාලීන පුහුණු පාඨමාලාවන් සඳහා මුළු වශයෙන් නිලධාරීන් 111 දෙනෙකු එතෙර ගිය අතර ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පුහුණුවීම් සඳහා නිලධාරීන් 464 දෙනෙකු සහභාගී වූහ. තවත් නිලධාරීන් 160 දෙනෙකු මෙරට අධ්‍යාපන ආයතනවල පවත්වන ලද වෙනත් පුහුණුවීමේ පාඨමාලා/ සම්මන්ත්‍රණ ආදියට සහභාගී වූහ.

මාණ්ඩලික පංතියේ ශිෂ්‍යත්ව සඳහා විභාගය සහ සමහර සේවක කාණ්ඩ උසස්කිරීම් පරීක්ෂණ පැවැත්වීම තවදුරටත් කරගෙන යන ලදී. මාණ්ඩලික පංතියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය 1994 දෙසැම්බර් මාසයේදී පැවැත්විණි.

කළමනාකාරිත්ව විගණන

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව සිය වැඩසටහන්වලට අනුකූලව 1994 වසර තුළදී මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවල විගණන කාර්යයන්හි නිරත විය. මෙම විගණන කාර්යයන් ඉටු කිරීමේ දී අභ්‍යන්තර පාලන ක්‍රම තුළ ඇති දුර්වලතා හුවා දැක්වීමට සහ ක්‍රම විගණන පිළිබඳ දැඩි අවධානයක් යොමු කිරීමට උනන්දු වන ලදී.

විගණන කාර්යයන්ට අමතරව සාමාලෝචනය වූ කාලපරිච්ඡේදය තුළදී දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා අංශය විසින් බැංකුවේ කළමනාකරණයට අදාල ඉතා වැදගත් අධ්‍යයන සහ සමීක්ෂණ රාශියක් ද පවත්වන ලදී. ඊට ඇතුළත් වූ අධ්‍යයනයන් පහත දැක්වේ.

1. මහ බැංකුවේ විවිධ සේවා කාණ්ඩයන්ට සහ ශ්‍රේණිවලට අදල සේවක සංඛ්‍යා පිළිබඳ සමාලෝචනයක් කිරීම.
2. අනියම් සහ කොන්ත්‍රාත් පදනම් මත සිටි සේවක පිරිස් ස්ථිර සේවයට ඇතුලත් කිරීම පිළිබඳ වාර්තාව.
3. සමහර සේවා කාණ්ඩයන්ට ඇතුළත් වන සේවකයින්ගේ වැඩ සහ රාජකාරි කටයුතු තීරණය කිරීම.
4. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය ප්‍රවාහය පිළිබඳ අධ්‍යයනය.
5. සමහර සේවා කාණ්ඩයන්ට ඇතුළත් වන සේවකයින්ට උසස්වීම් සඳහා ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳ අධ්‍යයනය.

පරිශ්‍ර

මහ බැංකු පරිශ්‍ර උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම සඳහා එදිනෙදා සිදු කෙරෙන සාමාන්‍ය නඩත්තු වැඩවලට අමතරව, පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති, 1994 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

1. මහබැංකුවට යාබද නව ගොඩනැගිල්ල

1992 මාර්තු මාසයේදී කැබිනට් තීරණයක් අනුව, අත්හිටුවන ලද මහ බැංකු නව

ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු, 1994 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදි. යටි මහල් 3 ක් හා අතුරු මහල් 4 ක් ඇතුළුව තට්ටු 9 කින් සමන්විත වන මෙම ගොඩනැගිල්ලේ සම්පූර්ණ භූමි ප්‍රමාණය වර්ග මීටර් 28,000 ක් පමණ වේ. පදිංචිය සඳහා එහි කටයුතු, 1997 අගෝස්තු මාසය වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ.

2. නුවරඑළිය

ඉදිකිරීම් කටයුතු අවසන් වූ ඒකක 15 කින් සමන්විත නිවාඩු නිකේතනය 1994 දෙසැම්බර් මාසයේදී අධිපතිතුමා විසින් උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී.

3. රාජගිරිය ක්‍රීඩා

මහ බැංකු ගරාජයට යාබද දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුවලින් සියයට 90 කට වඩා 1994 දෙසැම්බර් මස අවසානයේදී නිම කොට ඇති අතර, 1995 අප්‍රේල් වන විට එය පදිංචිය සඳහා සූදානම් කිරීමට අදහස් කෙරේ.

4. කතරගම

නිදන කාමර 2 කින් යුත් ඒකක 3 කින් සමන්විත වන්දනා නිකේතනය හා කාර්යාල ගොඩනැගිල්ල, 1994 අගෝස්තු මාසයේදී නිමවූ අතර, එය වන්දනාව සඳහා යන මහ බැංකු නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කොට ඇත.

සුභසාධනය

සැළකිල්ලට භාජනය වී ඇති කාලච්ඡේදය තුළදී සුභසාධන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් සුභසාධන පහසුකම් සහ සේවා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ට තවදුරටත් ලබා දෙන ලදී.

01. නිවාස ණය ක්‍රමය
02. කාර්ය මණ්ඩල සුභ සාධන ක්‍රමය
03. වාහන ණය ක්‍රමය
04. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය
05. අර්ථසාධක ණය ක්‍රමය
06. මහ බැංකු ආපන ශාලාව
07. මහ බැංකු වෛද්‍ය අංශය.

1994 වසර තුළදී ඉහත සඳහන් සුභසාධන පහසුකම් රාශියක් සැලකිය යුතු ප්‍රමාණයකට පුළුල් කරන ලදී.

රජයේ නියෝගයන්ට අනුකූලව මහ බැංකු ආපනශාලාවේ සහ වෛද්‍ය සායනයේ සේවය කළ අනියම් හා කොන්ත්‍රාත්තු සේවකයන් ස්ථිර සේවයට බඳවා ගන්නා ලදි.

මහ බැංකු ආපනශාලාව මගින් සේවකයන් සඳහා පිරිවැය මිළට උදේ සහ දවල් ආහාර සැපයීම තවදුරටත් කරන ලදී. සෑම දෙපාර්තමේන්තුවකම සේවකයන් සඳහා උදේ සහ සවස තොමිලේ තේපැන් සැපයීම ද කරන ලදී. කාර්යාලයීය උත්සව සඳහා ආහාර පාන සැපයීම ද ආපනශාලාව මගින් තවදුරටත් කරන ලදී.

බැංකු වෛද්‍ය සායනය සඳහා වැඩ කරන දිනයන්හි සම්පූර්ණ කාලය තුළ රැඳී සිටින වෛද්‍යවරයෙක් සිටී. වෛද්‍යවරයාගේ සහය සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් හෙදියක් සහ රසායනාගාර ශිල්පියෙක් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිටී. අත්‍යවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ මහ බැංකු වෛද්‍ය පර්යේෂණාගාරයේදී කරනු ලැබේ. මහ බැංකු ඖෂධාගාරයෙහි බෙහෙත් ද්‍රව්‍ය ඇති අතර, සේවකයන්ට ලබා දෙන වෛද්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කිරීම සඳහා නවීන වෛද්‍ය පරීක්ෂණ උපකරණද බැංකු වෛද්‍ය සායනයට ලබා දී ඇත.

ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

1994 වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුව විසින් කරන ලද ප්‍රධාන කාර්යය වූයේ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලට හා රාජගිරියේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයීය ගොඩනැගිල්ලටත්, කාගෝ බෝට් ඩිස්පැච් ගොඩනැගිල්ලේ, සෙලින්කෝ මන්දිරයේ හා ෂාලිමාර් ගොඩනැගිල්ලේත් පිහිටුවා ඇති බැංකුවේ දෙපාර්තමේන්තුවලට ආරක්ෂාව සැපයීමයි. මීට අමතරව අනුරාධපුරය, මාතර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාලවලටද, කැළණියේ හා ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේහි පිහිටා ඇති ගබඩාවලටද, කතරගම සංචාරක බංගලාවටද, නුවරඑළියේ නිවාඩු නිකේතනයටද, මහනුවර පිහිටි බිම් කොටසටද ආරක්ෂාව සපයන ලදී. අධිපතිතුමාගේ හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිතුමාගේ නිවෙස්වලටද ආරක්ෂාව සපයන ලදී.

මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලයට හා ප්‍රධාන කාර්යාලයේ සිට මුදල් හා රත්තරන් ගෙන යෑමේදී ඒවා භාරව යෑමේ රාජකාරිය ඉටු කරන ලද අතර අධිපතිතුමාට හා ශ්‍රී ලංකා මහබැංකුවට පැමිණෙන විදේශීය නියෝජිතයින්ට පුද්ගලික ආරක්ෂාව ද සපයන ලදී.

දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන්ගේ දැනුම හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම අරභයා ආරක්ෂක කටයුතු සම්බන්ධ පුහුණු පාඨමාලා කිපයක් පැවැත්වීම පිණිස ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයට මෙම දෙපාර්තමේන්තුව මගින් සහාය දෙන ලදී.

කාර්ය මණ්ඩල පුවත්

1994 වර්ෂයේදී අධිපති එච්. බී. දිසානායක මහතා මෙහි පහත සඳහන් රැස්වීම්වලට සහභාගි විය.

1. තායිලන්තයේ බැංකොක් නුවර පවත්වන ලද 30 වැනි ඇප්‍රකා විධායක මණ්ඩල රැස්වීම
2. පිලිපීනයේ මැනිලා නුවර පවත්වන ලද සංවර්ධන උපාය ක්‍රම පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ 6 වැනි වට මේස සාකච්ඡාව.
3. ප්‍රංශයේ පැවැත්වූ ආසියානු සංවර්ධන බැංකුවේ අධිපති වරුන්ගේ මණ්ඩලයේ 27 වැනි වාර්ෂික රැස්වීම.
4. ලන්ඩන් නුවර පවත්වන ලද එංගලන්ත බැංකුවේ 3 වැනි ශත සංවත්සර රැස්වීම සහ ස්විට්සර්ලන්තයේ බැස්ලේ නුවර පවත්වන ලද ඉන්ටර්නැෂනල් සෙට්ල්මෙන්ට්ස් බැංකුවේ (බීඅයිඑස්) 64 වැනි වාර්ෂික මහා සභාව
5. තායිලන්තයේ බැංකොක් නුවර පවත්වන ලද ඇප්‍රකා විධායක මණ්ඩල රැස්වීමේ ආරම්භක සාකච්ඡා වාරය සහ ස්පාඤ්ඤයේ, මැඩ්රිඩ් නුවර පවත්වන ලද ජාමුඅ/ලෝක බැංකු කණ්ඩායමේ වාර්ෂික රැස්වීම.
6. නේපාලයේ, කත්මණ්ඩු නුවර පවත්වන ලද 31 වැනි ඇප්‍රකා විධායක මණ්ඩල රැස්වීම.

පත්වීම්

1. දත්ත සැකසුම් අධ්‍යක්ෂ ආචාර්ය එස්. එස්. කොළඹගේ මහතා 1994 ජනවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදි.
2. සංඛ්‍යාන අධ්‍යක්ෂ ආචාර්ය එල්. එල්. ගුණරත්න මහතා 1994 ජනවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදි.
3. දත්ත සැකසුම් නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. එන්. ප්‍රනාන්දු මහත්මිය 1994 ජනවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි දත්ත සැකසුම් වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදි.
4. බැංකු සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්. ටී. බී. ජයසුන්දර මහතා 1994 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක රාජ්‍ය ණය අධිකාරී වශයෙන් පත් කරන ලදි.

5. නියෝජ්‍ය අර්ථ සාධක අරමුදල් අධිකාරී එම්. එස්. සිරිපාල මහතා 1994 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක ආයතන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

6. ග්‍රාමීය ණය නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්. රාමනාදන් මහතා 1994 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු අධීක්ෂණ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

7. අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී සී. කේ. පරණවිතාන මහතා 1994 ජූනි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි අතිරේක ලේකම් වශයෙන් පත් කරන ලදී.

8. වයි. ඒ. පියතිස්ස මහතා විශේෂ නිලධාරී (ප්‍රාග්ධන හා මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධන) ලෙස 1994 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

9. අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ජේ. ඊ. ඩී.. කරුණාරත්න මහතා 1994 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

10. බැංකු අධීක්ෂණ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ එම්. රාමනාදන් මහතා 1994 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

මුදා හරිනු ලැබ සිටි නිලධාරීන් (1994 දෙසැම්බර් 31 වන දිනට)

අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවල සහ ජාත්‍යන්තර ආයතනයන්හි තනතුරු සඳහා පහත නම් සඳහන් බැංකු නිළධාරීහු මුදා හරිනු ලැබ සිටියහ.

ඒ. එස්. ජයවර්ධන මහතා ලේකම් වශයෙන් මුදල්, ක්‍රමසම්පාදන, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු මහතා බංගලාදේශය, භූතානය, ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය ආර්. ජයමහ මහත්මිය මුදල්, ක්‍රමසම්පාදන, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඩී. ජේ. ජී. ප්‍රනාන්දු මහතා මහජන බැංකුවේ සභාපති හා අධ්‍යක්ෂ වශයෙන් මුදල්, ක්‍රමසම්පාදන, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත.

සී. ලියනගේ මහතා, ඩබ්ලිව්. ඒ. ඩී. ඊ. වීරසිංහ මහතා, එන්. එම්. දයාරත්න මහතා, සී. ද එස්. ජයවර්ධන මහතා මුදල් ක්‍රමසම්පාදන, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත.

විශ්‍රාම ගැනීම් / ඉල්ලා අස්වීම්

සේවක අර්ථ සාධක අරමුදලේ අතිරේක අධිකාරී ඉසෙඩ් ලොකුගේ මහත්මිය 1994 ජූලි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

අතිරේක ආයතන අධ්‍යක්ෂ පී. එම්. ලක්දවල මහතා 1994 ඔක්තෝබර් 07 දින සිට ක්‍රියාත්මකවන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.